# දෙවැනි කොටස


මහ බැංකුවේ ගිණුම් හා කටයුතු ... ... I – XLII

කාර්ය මණ්ඩල පුවත් ... ... XLIII – XLVI

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | පිටුව |
|---|---|
| ගිණුම් හා බැංකු කටයුතු ... ... ... ... | I |
| ව්‍යවහාර මුදල් නිකුතුව ... ... ... ... | VII |
| බැංකු සංවර්ධන ... ... ... ... | VII |
| බැංකු අධීක්ෂණය ... ... ... ... | VIII |
| සංවර්ධන මුදල් ... ... ... ... | X |
| ග්‍රාමීය ණය ... ... ... ... | XIV |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ... ... ... | XX |
| ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය ... ... | XXIV |
| සේවක අර්ථ සාධක අරමුදල්... ... ... ... | XXV |
| විනිමය පාලන ... ... ... ... | XXVII |
| රාජ්‍ය ණය ... ... ... ... | XXIX |
| ප්‍රාදේශීය කාර්යාලය—මාතර ... ... ... | XXX |
| ප්‍රාදේශීය කාර්යාලය—අනුරාධපුරය ... ... ... | XXXIII |
| ප්‍රාදේශීය කාර්යාලය—මාතලේ ... ... ... | XXXVI |
| ප්‍රකාශන ... ... ... ... | XXXVIII |
| සම්මන්ත්‍රණ ... ... ... ... | XXXVIII |
| පර්යේෂණ කටයුතු ... ... ... ... | XXXIX |
| සමීක්ෂණ ... ... ... ... | XXXIX |
| පුහුණු කිරීම ... ... ... ... | XL |
| දත්ත සැකසුම් ... ... ... ... | XLI |
| කළමනාකාරිත්ව විගණන ... ... ... ... | XLII |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

## ගිණුම් හා බැංකු කටයුතු

1987 දෙසැම්බර් 31 වැනි දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය සහ 1987 දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වූ වර්ෂය සඳහා වූ ලාභාලාභ ගිණුම 2.1 සංඛ්‍යා සටහනෙහි දක්වේ.

1987 අවසානයේදී මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය ඉකුත් වසරේ පැවති මට්ටමට වඩා සියයට 5.3 ක වැඩි වීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 45,444.2 ක් විය. වත්කම්වල වැඩිවීම, දේශීය වත්කම් (සියයට 6 කින්) ඉහළ යාමේත්, අනෙකුත් වත්කම් හා ගිණුම් (සියයට 23.5 කින්) වැඩි වීමේත් ප්‍රතිඵලයක් විය. දේශීය වත්කම් අතුරෙන් රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් (සියයට 13.9 කින්) හා මැදි හා දිගුකාලීන ණයවල (සියයට 34.4 කින්) සැලකිය යුතු වැඩි වීමක් වාර්තා විය. කෙටිකාලීන ණය මුදල් හා රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් පිළිවෙලින් සියයට 3.6 කින් හා සියයට 3.3 කින් වැඩි වූ අතර, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය සියයට 7.4 කින් පහත වැටුණි.

වර්ෂය තුළදී මහ බැංකුවේ වගකීම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විදේශයන්ගෙන් ණය ගැනීමය. පසුගිය වර්ෂය අවසානයේදී පැවති 'ශූන්‍ය' ශේෂයක් හා සසඳන කල, විදේශීය ණය ගැනීම් ගිණුම 1987 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 1,801.7 ක්ව පැවතුණි. මහ බැංකුවේ වගකීම්වල වූ අනෙකුත් වැඩිවීම් නම් සංසරණයෙහි පැවති ව්‍යවහාර මුදල් (සියයට 17.1 කින්), මැදි හා දිගුකාලීන ණය අරමුදල (සියයට 24.4 කින්), ප්‍රාග්ධන දයක ගිණුම (සියයට 25 කින්) සහ අනෙකුත් වගකීම් හා ගිණුම් (සියයට 17.5 කින්) ය. මහ බැංකු සුරැකුම්පත් (සියයට 99.2 කින්) හා තැන්පතු (සියයට 23.1 කින්) සැලකිය යුතු ලෙස පහත වැටීම මගින් ඉහත සඳහන් වැඩිවීම්වල බලපෑම තරමක් දුරට සමහන් කෙරුණි.

1987 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 4,057. 2 ක් වූ මහ බැංකුවේ ආදායම ඉකුත් වර්ෂයේ පැවති ප්‍රමාණයට වඩා සියයට 10 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. වියදම් සඳහා ඉඩ හැර, සංචිත ගිණුම් හා ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසු මහ බැංකුවේ ශුද්ධ ලාභය රුපියල් දශ ලක්ෂ 1,651 ක් විය. මුදල් නීති පනතේ 39(ආ) වගන්තිය අනුව බැංකුවේ අතිරික්තයට රුපියල් දශ ලක්ෂයක් පැවරිය යුතුව ඇත. රුපියල් දශ ලක්ෂ 1,650 ක ශේෂය, රජය විසින් මහ බැංකුව වෙත ගෙවීමට ඇති ණයෙන් කොටසක් පියවීමේදී උපයෝගී කර ගැනීම සඳහා මුදල් නීති පනතේ 39(ඇ) වගන්තිය ප්‍රකාර රජයට ගෙවීම පිණිස වෙන් කොට ඇත.

### විදේශ විනිමය කටයුතු

වාණිජ බැංකු සමග කෙරෙන ගණුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලරයේ දෛනික එතැන් මිළදී ගැනුම් හා විකුණුම් අනුපාතිකයන් නිර්ණය කිරීම මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. එක්සත් ජනපද (එ. ජ.) ඩොලර් සඳහා එතැන් මිළදී ගැනුම් හා විකුණුම් අනුපාතිකයන් අතර වූ පරතරය 1987 මාර්තු මස 09 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි එ. ජ. ඩොලර් 100 ක් සඳහා රුපියල් 1.50 සිට රුපියල් 3.00 දක්වා පුළුල් විය. වාණිජ බැංකු සම්බන්ධයෙන් එ. ජ. ඩොලර් සඳහා වූ එතැන් විකිණීම් ඒ සමගම නවතා දමන ලදී. 1987 දෙසැම්බර් මස අවසානය වනවිට එ. ජ. ඩොලර් සඳහා මිළදී ගැනීමේ හා විකිණීමේ එතැන් අනුපාතිකයන් පිළිවෙලින් රුපියල් 30.7475 ක් හා රුපියල් 30.7775 ක් විය.

ඉදිරි විනිමය අනුපාතිකයන්ගේ ස්ථාවරත්වය පවත්වාගෙන යාම සඳහා ඉදිරි එ. ජ. ඩොලර් විකිණීම මගින් වෙළෙඳපලට මැදිහත්වීම මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. ඉදිරි විකිණීම් සඳහා එම ආවරණ කාල පරිච්ඡේදය මාස තුනක් දක්වා විය.

## ශ්‍රී ලංකා

## 1987 දෙසැම්බර් 31 වැනි

### වගකීම්

| 1986 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1987 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | ප්‍රාග්ධන ගිණුම් | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය .. | 1,50,00,000 | |
| 8,00,00,000 | 9,50,00,000 | අතිරික්තය .. | 8,10,00,000 | 9,60,00,000 |
| | | සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් | | |
| 1,222,90,00,668 | | නෝට්ටු .. | 1,437,32,90,993 | |
| 63,42,41,496 | 1,286,32,42,164 | කාසි .. | 68,98,12,604 | 1,506,31,03,597 |
| | | තැන්පතු | | |
| 171,08,10,540 | | රජය .. | 155,32,55,643 | |
| 12,27,32,153 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන .. | 16,31,15,650 | |
| 504,53,39,209 | | වාණිජ බැංකු .. | 404,69,16,751 | |
| 246,31,97,152 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන .. | 58,15,03,815 | |
| | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 17,76,13,005/- හැර | | |
| 1,03,942 | | අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල .. | 91,413 | |
| 66,45,31,455 | 1,000,67,14,451 | අනෙකුත් .. | 135,42,68,631 | 769,91,51,903 |
| | — | විදේශීය ණය ගැනීම් .. | | 180,16,53,900 |
| | 102,50,00,000 | මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදල .. | | 127,50,00,000 |
| | 16,00,00,000 | ප්‍රාග්ධන දයක දීමනා ගිණුම .. | | 20,00,00,000 |
| | 260,36,33,000 | ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් | | 1,95,75,000 |
| | 1,641,03,54,180 | අනෙකුත් වගකීම් හා ගිණුම් .. | | 1,928,97,14,583 |
| | 4,316,39,43,795 | | | 4,544,41,98,983 |

## 1987 දෙසැම්බර් මස 31 වැනි දිනෙන්

| 1986 රුපියල් | | | 1987 රුපියල් | |
|---|---|---|---|---|
| | 172,92,74,810 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා ඉඩම් සහ ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂය කිරීම් ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර කරන ලද වෙන් කිරීම | | 234,25,06,824 |
| | | 1987 දෙසැම්බර් 31 වැනිදයින් අවසන්වූ වර්ෂයේ ශුද්ධ ලාභය | | |
| 23,62,55,802 | | මූල්‍ය ගැලපීම් ගිණුමට මුදල් නීති පනතේ 39 (අ) වගන්තිය ප්‍රකාර ශේෂය පියවීමට | 6,36,27,154 | |
| 10,00,000 | | මුදල් නීති පනතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයක් වශයෙන් යොද ගන්නා ලදී. | 10,00,000 | |
| 172,30,00,000 | 196,02,55,802 | මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජය – ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට | 165,00,00,000 | 171,46,27,154 |
| | 368,95,30,612 | | | 405,71,33,978 |

**වර්ණසේන රාසපුත්‍රම්**
අධිපති

**එන්. ඒ. ධර්මබන්දු**
ප්‍රධාන ගණකාධිකාරි

1988 මාර්තු 22 වැනි දින.

## මහ බැංකුව

### දිනට ශේෂ පත්‍රය

**වත්කම්**

| 1986 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1987 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | ජාත්‍යන්තර සංචිතය | | |
| 472,89,55,695 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් .. | 320,48,21,056 | |
| 481,03,89,476 | | *විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් .. | 562,99,46,335 | |
| 84,801 | 953,94,29,972 | විශේෂ ආපසු ගැනීම් හිමිකම්පත් | 33,98,272 | 883,81,65,663 |
| | | දේශීය වත්කම් | | |
| | | ණය සහ අත්තිකාරම් | | |
| 462,54,61,262 | | රජයට .. | 526,86,73,355 | |
| | | අනෙකුත් අයට-මධ්‍යම හා | | |
| 74,85,40,277 | | දීර්ඝ කාලීන .. | 100,58,73,320 | |
| 240,37,93,574 | | කෙටිකාලීන .. | 249,02,82,769 | |
| 2,022,05,60,536 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් .. | 2,088,81,61,290 | |
| 16,00,00,000 | 2,815,83,55,649 | මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දයක දීමනා .. | 20,00,00,000 | 2,985,29,90,734 |
| | 546,61,58,174 | අනෙකුත් වත්කම් හා ගිණුම් .. | | 675,30,42,586 |
| | | *1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 55,27,675/- ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 57,450/- ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතන-වලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු. 29,33,697/- ක් හා රු. 34,340/- ක් විය.) | | |
| | 4,316,39,43,795 | | | 4,544,41,98,983 |

### අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

| 1986 රුපියල් | | | 1987 රුපියල් | |
|---|---|---|---|---|
| | 368,95,30,612 | පොළී ආදිය .. | | 405,71,33,978 |
| | 368,95,30,612 | | | 405,71,33,978 |

1987 දෙසැම්බර් මස 31 වැනි දිනට අවසන් වූ වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සහ මුදල් නීති පනතේ (පරි. 422) 42(1) වගන්තිය අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මුදල් නීති පනතේ (පරි. 422) 42(2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමතිතුමා වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරේ.

කොළඹ 7.

විගණන කාර්යාලයේදීය,

1988 අප්‍රේල් 20 දින.

එස්. එම්. සබ්රි

වැඩ බලන විගණකාධිපති

**ආසියානු නිෂ්කාශණ සංගමය**

1987 වර්ෂය තුළදී ආසියානු නිෂ්කාශණ සංගමයේ පහසුකම් තුළින් කළ ගණුදෙනුවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 7,252.5 ක් විය. මෙය පසුගිය වර්ෂය තුළදී කළ ගණුදෙනුවල මුළු වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 7,907.6 හා සැසඳේ.

1986 දී රුපියල් දශ ලක්ෂ 925.6 ක් වූ ශුද්ධ ගෙවීම් හා සසඳන කල විමර්ශණයට භාජනය වූ වර්ෂය සඳහා වූ ශුද්ධ ගෙවීම් රුපියල් දශ ලක්ෂ 576.6 ක් විය.

එතැන් පදනමක් මත හා මාස 6 ක් දක්වා වූ ඉදිරි ගිවිසුම් මත විදේශීය මුදල් විකිණීම් හා මිළදී ගැනීම් තවදුරටත් කරගෙන යන ලදී. මේ සම්බන්ධයෙන් අදාළ මුදල් වර්ග වූයේ බංගලිදේශ ටාකා, බුරුම ක්යාට්, ඉන්දියානු රුපියල්, ඉරාන රියාල්, නේපාල රුපියල් හා පකිස්ථානු රුපියල් ය.

**කෙටිකාලීන ණය**

රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් හා වාණිජ හා නිෂ්පාදන ණයවලට අදාළ භාවිතිය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන අත්තිකාරම් සඳහා වූ මහ බැංකුවේ පොළී අනුපාතිකය (බැංකු අනුපාතිකය) 1987 අගෝස්තු මස 07 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි වසරකට සියයට 11 සිට සියයට 10 දක්වා පහත හෙළන ලදී.

අපනයන කටයුතු සඳහා ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට ණය සැපයීම වසර මුළුල්ලේම නොකඩවා ක්‍රියාත්මක විය. I වැනි හා II වැනි කාණ්ඩ යටතේ ගැනෙන අපනයන ප්‍රතිමූල්‍ය ණය සඳහා වූ දින 90 කාලසීමාව නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, කාණ්ඩ දෙක යටතේම ගැනෙන එක් එක් ඉල්ලීමෙහි සාධාරණත්වය වෙන් වෙන්ව සළකා බලා එම කාලසීමාව දින 120 ක් දක්වා තවදුරටත් දින 30 කින් දීර්ඝ කිරීමට ඉඩ සලසන ලදී.

I වැනි කාණ්ඩය යටතේ ගැනෙන අපනයන සඳහා වූ ප්‍රතිමූල්‍ය ණය පොළී අනුපාතිකය වසරකට සියයට 11 වශයෙන්ද, ණය දීමේ අනුපාතිකය වසරකට සියයට 14 වශයෙන්ද නොවෙනස්ව පැවතුණි. II වැනි කාණ්ඩය යටතේ ගැනෙන අපනයන සඳහා අදාළ අනුරූපී පොළී අනුපාතික ඉකුත් වසරේ මෙන්ම පිළිවෙලින් සියයට 6 ක් හා සියයට 9.8 ක් වශයෙන් පැවතුණි. වර්ෂය තුළදී අපනයන ණය ප්‍රතිමූල්‍ය පහසුකම්වල I වන කාණ්ඩය යටතේ වූ අපනයන වෙනුවෙන් වාණිජ බැංකුවලට ලබා ගත හැකි මුළු ප්‍රතිමූල්‍ය පහසුකම්වල සීමාව රුපියල් දශ ලක්ෂ 1,663.4 ක් විය. අදාළ අපනයනයන්හි විකුණුම් ආදයම නියමිත කාලසීමාව තුළදී ශ්‍රී ලංකාවට ලැබුණු විට, දෙන ලද ප්‍රතිමූල්‍ය ණය මුදල් සඳහා අය කළ පොළී අනුපාතිකයෙන් වසරකට සියයට 4 ක ප්‍රමාණයක් ගණුදෙනුකරුවන්ට ආපසු ගෙවනු ලැබිය. කෙසේවුවද, කාණ්ඩ දෙවර්ගයම සඳහා මෙම ප්‍රතිදනය දෙනු ලබනුයේ දින 90 වේ මුල් කාලසීමාව සඳහා පමණි.

වී, එළවළු හා විශේෂයෙන් සඳහන් කරන ලද වෙනත් ආහාර භෝග වර්ග නිෂ්පාදනය හා සම්බන්ධ සමුපකාර සමිතිවල හෝ පුද්ගලයන්ගේ භාවිතිය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන දෙනු ලබන මහ බැංකු අත්තිකාරම් සඳහා වූ පොළී අනුපාතිකය වසරකට සියයට 1.5 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. මෙම අත්තිකාරම් මුදල් දෙනු ලැබුයේ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේය. තවද, මෙම සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ වාණිජ බැංකු විසින් දෙනු ලබන ණය, සහතික කිරීමද මහ බැංකුව විසින් නොකඩවා කරගෙන යන ලදී. වී මිළදී ගැනීම සහ දේශීය වශයෙන් වගා කරනු ලබන විශේෂයෙන් සඳහන් කරන ලද වෙනත් සමහර භෝග වර්ග මිළට ගැනීම හා ගබඩා කිරීම සඳහා සමුපකාර සමිති, ගොවිජන සේවා මධ්‍යස්ථාන හා බලය ලත් පුද්ගලයන් හට දෙනු ලැබූ අත්තිකාරම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන වාණිජ බැංකුවලට දෙනු ලබන අත්තිකාරම් සඳහා වූ පොළී අනුපාතිකය සියයට 3 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි.

### මැදි හා දිගුකාලීන ණය

මැදි හා දිගු කාලීන ණය අරමුදල යටතේ වූ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය මහ බැංකුව විසින් 1987 වසර තුළදීද නොකඩවා ක්‍රියාත්මක කරනු ලැබීය. සංචාරක කර්මාන්තයට දෙන ලද ණය සම්බන්ධයෙන් වූ හිඟ පොළී හා ණය වාරික ප්‍රාග්ධනගත කිරීම සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීමද, ධීවර අංශයේ බැංකු පුනරුත්ථාපන ණය සහ චීන ඉඟුරු වගා කිරීම සඳහා දෙන ලද ණය ප්‍රතිලේඛනගත කිරීමේ ක්‍රමය යටතේ ණය දෙන බැංකුවලට පොළී රහිත ණය සැපයීම ද මහ බැංකුව විසින් නොකඩවා කරගෙන යන ලදී. 1986 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 1,025 ක්ව පැවති මැදි හා දිගු කාලීන ණය අරමුදලේ ශේෂය 1987 දෙසැම්බර් අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 1,275 ක් දක්වා වැඩි විය. මෙම අරමුදල යටතේ ණය ආයතනයන්ට දෙන ලද ණයවලින් රුපියල් දශ ලක්ෂ 1,005.9 ක් 1987 දෙසැම්බර් මස 31 වන දින වන විට නොගෙවා ඉතිරිව පැවතුණි. ඉහත කී ක්‍රමය යටතේ දෙන ලද ප්‍රතිමූල්‍ය ණය පහසුකම්වලට අදළ පොළී අනුපාතිකයන් පහත දැක්වෙන පරිදි නොවෙනස්ව පැවතුණි.

**2 . 2 සංඛ්‍යා සටහන**

**මැදි හා දිගුකාලීන ප්‍රතිමූල්‍ය ණය සඳහා පොළී අනුපාතික**

| කාණ්ඩය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය (මුළු ණය මුදලේ ප්‍රතිශතයක් ලෙස) | ණය මුදලේ කාලසීමාව (අවුරුදු) | ප්‍රතිමූල්‍ය පොළී අනුපාතිකය % | | ණය දෙන ආයතනයට නියමිත ආන්තිකය % | |
|---|---|---|---|---|---|---|
| | | | (අ) ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. ද. ල. 5 ට අඩු | (ආ) ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. ද. ල. 5 ට වැඩි | (අ) ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. ද. ල. 5 ට අඩු | (ආ) ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. ද. ල. 5 ට වැඩි |
| I | 100 | 3 – 15 | 8·5 | 8·5 | 4·0 | 4·0 |
| II | 70 | 3 – 15 | 7·0 | 8·0 | 2·0 | 2·0 |
| III | 60 | 3 – 15 | 8·0 | 8·0 | 4·0 | 4·0 |
| IV | 60 | 3 – 15 | 10·0 | 10·0 | 4·0 | 4·0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

මැදි හා දිගුකාලීන ණය සහතික ක්‍රමය 1987 මාර්තු මස 16 වැනි දින සිට ක්‍රියාත්මක විය. ඒ අනුව මැදි හා දිගු කාලීන ණය ක්‍රමයේ I වන කාණ්ඩය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා නම් කරන ලද ණය ක්‍රම යටතේ දෙන ලද ණය, සහතික කරනු ලැබේ. 1987 දී '' කිරි පට්ටි සංවර්ධන ණය යෝජනා ක්‍රමය '' සහ '' ශ්‍රී ලංකා ආසියානු සංවර්ධන බැංකු පශු සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය '' ණය සහතික ක්‍රමය යටතට ගෙන එන ලදී.

### වාණිජ බැංකු ණය

1984 දී පනවන ලද ණය සීමාවන් 1987 වසර තුළදීද නොකඩවා ක්‍රියාත්මක විණි. මෙම සීමාවන්ට අනුව සියළුම වාණිජ බැංකු විසින් පහත දැක්වෙන කරුණු පිළිපැදිය යුතු බවට මහ බැංකුව විසින් නියම කර ඇත.

(අ) අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සඳහා දෙනු ලබන මුළු අත්තිකාරම් ප්‍රමාණය 1984 මාර්තු 23 වෙනි දිනට දෙනු ලැබ නොපියවා පැවති අත්තිකාරම් ප්‍රමාණය නොඉක්මවිය යුතුය.

(ආ) අත්‍යාවශ්‍ය නොවන ආනයන වෙනුවෙන් 1984 මාර්තු 23 වෙනි දිනට නොපියවා පැවති මට්ටම ඉක්මවා තනි ආනයන කරුවනට ණය නොදිය යුතුය.

(ඇ) අපනයන, කෘෂි කර්මාන්තය සහ කර්මාන්ත හැර වෙනත් කටයුතු සඳහා පෞද්ගලික අංශයට දෙනු ලැබ නොපියවා පැවති මුළු අත්තිකාරම් ප්‍රමාණය 1984 මැයි මස 11 වෙනි දිනට දෙනු ලැබ නොපියවා පැවති එවැනි අත්තිකාරම්වල මුළු ප්‍රමාණයෙන් සියයට 5 ක් නොඉක්මවිය යුතුය.

**සංචිත අවශ්‍යතාවයන්**

ප්‍රයෝජනයට නොගත් අයිරාවන්ගේ ශේෂ මත සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවය 1987 ජූනි මස 05 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවන ලදී.

1987 අගෝස්තු මස 07 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයන් ඉල්ලුම් තැන්පතු සම්බන්ධයෙන් සියයට 18 සිට 10 දක්වාද, දින 90 නොඉක්මවන කාලීන තැන්පතු සඳහා සියයට 14 සිට සියයට 10 දක්වාද අඩු කරන ලදී. දින 90 ඉක්මවන කාලීන තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු හා විශේෂ තැන්පතු සම්බන්ධයෙන් වූ සංචිත අනුපාතය සියයට 10 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි.

**ද්විතීය වෙළෙඳපොළේ භාණ්ඩාගාර බිල්පත් ගණුදෙනු**

මහ බැංකුව ද්විතීය වෙළෙඳපොළේ භාණ්ඩාගාර බිල්පත් ගණුදෙනුවල තවදුරටත් නිරත විය. 1986 දී රුපියල් දශ ලක්ෂ 74,295.1 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල විකුණුම් පිරිවැටුම 1987 දී රුපියල් දශ ලක්ෂ 47,808.4 දක්වා අඩු විය. මෙම කාලය තුළදී ගැනුම් පිරිවැටුමද රුපියල් දශ ලක්ෂ 31,817.3 සිට රුපියල් දශ ලක්ෂ 24,255.5 දක්වා පහත වැටුණි.

වර්ෂය තුළදී ඒක්ෂණ මුදල් වෙළෙඳපොළේ පොළී අනුපාතික වසරකට සියයට 5.375 සිට 20.0 දක්වාද, ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ කටයුතු වලට අදාල වට්ටම් අනුපාතික වසරකට සියයට 10.3 සිට 11.0 දක්වා ද වරින් වර වෙනස් විය.

**මෙරට හැර යන ඉන්දියානුවන් සඳහා සහනාධාර හා කරුණාසහගත ගෙවීම්**

1964 ඉන්දු-ලංකා ගිවිසුම යටතේ ගැනෙන ඉන්දියානු සම්භවයක් ඇති වතු කම්කරුවන් පෙරළා සිය රට යැවීම කඩිනම් කරවනු සඳහා මහ බැංකුව විසින් රජය වෙනුවෙන් යෝජනා ක්‍රම දෙකක් නොකඩවා ක්‍රියාත්මක කරනු ලැබීය. එම යෝජනා ක්‍රම දෙක නම්,

(අ) එසේ පෙරළා සිය රට යන්නන් හට ප්‍රේෂණය කිරීමට අනුමත කරන ලද මුදල් ප්‍රමාණයෙන් සියයට 65 කට සමාන මුදලක් හෝ ඉන් කොටසක් ගෙවීමේ සහනාධාර ක්‍රමය ; සහ

(ආ) එම කම්කරුවන්ට ශ්‍රී ලංකාව හැර යාම සඳහා දිරි ගැන්වීමක් වශයෙන් කරුණාසහගත ගෙවීමක් ලෙස එක් අයෙකුට රුපියල් 500 ක් හා එම මුදලින් සියයට 65 ක් ගෙවීමේ ක්‍රමය ;

මහ බැංකුව විසින් මෙම ක්‍රම දෙක වාණිජ බැංකු මඟින් ක්‍රියාත්මක කරවන ලදී.

**අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල**

1971 අංක 6 දරණ අනිවාර්ය ඉතිරි කිරීමේ පනත හා 1972 අංක 15 දරණ ආදායම් සීමා කිරීමේ සහ අනිවාර්ය ඉතිරි කිරීමේ නීතිය යටතේ රැස් කළ මුදල්වල භාරකරු ලෙසද, රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල් පරිපාලනයද මහ බැංකුව විසින් නොකඩවා කරගෙන යන ලදී. වර්ෂය තුළදී බැංකුව විසින් පොළියද ඇතුළුව රුපියල් දශ ලක්ෂ 3.3 ක මුදලක් දයකයනට ගෙවන ලදී.

**අපනයනකරුවන් සඳහා ආනයන බදු ප්‍රතිදන**

අපනයනකරුවන්ගේ බදු ප්‍රතිදන හිමිකම් ගෙවීම කඩිනම් කිරීමට ගත් රජයේ තීරණය අනුව මහ බැංකුව විසින් 1987 මාර්තු මාසයේදී ආනයන බදු ප්‍රතිදන සඳහා වෙනම අංශයක් බැංකු කටයුතු දෙපාර්තමේන්තුවෙහි පිහිටුවන ලදී. මෙම වැඩ පිළිවෙල අනුව, අපනයනකරුවන්ගේ බදු ප්‍රතිදන හිමිකම් ඔවුන්ගේ බැංකුකරුවන් විසින් පියවා දමනු ලබන අතර, එම හිමිකම් පත් අදළ බැංකු විසින් මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රතිපූරණය කරනු ලැබේ. මේ ක්‍රමය අනුව, 1987 වසර තුළදී ගෙවන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 199.3 ක් විය.

**රාජ්‍ය ගිණුම්**

රජයේ බැංකුකරු වශයෙන් බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ගිණුම් ශාඛාව විසින් රජයේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතනවල සහ සමහර ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් පවත්වාගෙන යාම නොකඩවා කරගෙන යන ලදී. 1987 දෙසැම්බර් මස අවසානය වනවිට රාජ්‍ය ගිණුම් ශාඛාවේ ක්‍රියාත්මකව පැවති ගිණුම් සංඛ්‍යාව 163 ක් විය.

## ව්‍යවහාර මුදල් නිකුතුව

1987 දෙසැම්බර් 31 වැනි දින වනවිට සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 15,063.1 ක් වූ අතර, එය රුපියල් දශ ලක්ෂ 14,373.3 ක නෝට්ටුවලින්ද රුපියල් දශ ලක්ෂ 689.8 ක කාසිවලින්ද සමන්විත විය. ඉකුත් වසර අවසානයේ වූ ප්‍රමාණය වන රුපියල් දශ ලක්ෂ 12,863.2 හා සසඳා බලන කල මෙය රුපියල් දශ ලක්ෂ 2,199.9 ක වැඩි වීමක් නියෝජනය කළේය. 1986 දෙසැම්බර් 31 වැනි දිනට සංසරණය වූ ප්‍රමාණයන් හා සසඳා බලන කල 1987 දෙසැම්බර් 31 වැනි දිනට සංසරණය වූ මුදල් නෝට්ටුවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,144.3 කින් (සියයට 18) වැඩිවූ අතර, සංසරණය වූ කාසිවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 55.6 කින් (සියයට 9) වැඩි විය.

වික්ටෝරියා වේල්ලෙහි දර්ශනයක් ඉදිරිපසද, රුහුණු විශ්ව විද්‍යාලයේ දර්ශනයක් පසුපසද දක්වෙන නව මෝස්තරයක රුපියල් 1,000 හේ මුදල් නෝට්ටුවක් වර්ෂයේ දෙවන භාගයේදී සංසරණය සඳහා නිකුත් කරන ලදී.

ව්‍යාජ මුදල් නෝට්ටු සංසරණයට එක්වීම වැළැක්වීමේ අමතර ආරක්ෂක පියවරක් වශයෙන් අනෙකුත් වටිනාකම්වලින් යුත් මුදල් නෝට්ටුවල දක්නට ලැබෙන සාමාන්‍ය ප්ලාස්ටික් නූල වෙනුවට ' ස්ටාර් ඩස්ට් ' නමින් හැඳින්වෙන අළුත් ආරක්ෂක නූලක් ඉහළ වටිනාකමින් යුත් මුදල් නෝට්ටු දෙක සඳහා ඇතුළත් කරන ලදී. 1987 ජනවාරි මස 1 වැනි දින හා ඉන්පසු දතම දක්වෙන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ සෑම මුදල් නෝට්ටුවකම මහ බැංකුවේ නිවැරදි කරන ලද නම වන '' සෙන්ට්‍රල් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා '' යන්න ඉංග්‍රීසි භාෂාවෙන් දක්වේ.

ශ්‍රී ලංකා රජයේ සහභාගිත්වය ඇතිව පිහිටුවන ලද ආරක්ෂණ මුද්‍රණ කටයුතු පිළිබඳ ඒකාබද්ධ ව්‍යාපාරයක් වූ සීමාසහිත බ්‍රැඩ්බරි විල්කින්සන් ලංකා (පෞද්ගලික) සමාගම 1987 මැයි මාසයේදී සිය කටයුතු ආරම්භ කළේය. ඒ අනුව, මහ බැංකුවට අවශ්‍ය වන සියළුම මුදල් නෝට්ටු අනාගතයේදී දේශීය වශයෙන් මුද්‍රණය කෙරෙනු ඇත.

නිවාස නොමැති අයට නිවාස ලබා දීමේ ජාත්‍යන්තර වර්ෂය සැමරීම සඳහා 1987 අප්‍රේල් මාසයේදී රුපියල් 10 ක වටිනාකමින් යුතු කාසියක් සංසරණය සඳහා නිකුත් කරන ලදී.

## බැංකු සංවර්ධනය

1987 වර්ෂයේදී බැංකු සංවර්ධන ක්ෂේත්‍රයේ ප්‍රධාන ලක්ෂණයක් වූයේ දේශීය බැංකු අංශය ශක්තිමත් වීමය. නව දේශීය පෞද්ගලික බැංකු දෙකක් සිය වැඩ කටයුතු ආරම්භ කිරීමත් සමඟ 1987 දී වාණිජ බැංකු අංශයේ ස යුතියෙහි කැපී පෙනෙනසුළු වෙනසක් සිදුවිය. මෙම නව බැංකු දෙකින් එකක් වන ''සීමාසහිත ආයෝජන සහ ණය බැංකුව'' පසුව ''සීමාසහිත සම්පත්

බැංකුව'' වශයෙන් නම වෙනස් කරනු ලැබූ අතර එය 1987 මාර්තු මාසයේදී සිය ව්‍යාපාරික කටයුතු ආරම්භ කළේය. ඒ අනුව, මෙරට ක්‍රියාත්මක වන දේශීය වශයෙන් සංස්ථාපනය කරන ලද වාණිජ බැංකු සංඛ්‍යාව 5 දක්වා වැඩි වුනු අතර, දේශීය පෞද්ගලික බැංකු සංඛ්‍යාව 3 දක්වා වැඩි විය. 1987 දෙසැම්බර් මාසයේදී මුදල් නීති පනතේ 121(බී) වගන්තිය යටතේ '' සීමාසහිත සෙයිලන් ට්‍රස්ට් බැංකුව '' නමින් දේශීය වශයෙන් සංස්ථාපනය කරන ලද තවත් පෞද්ගලික වාණිජ බැංකුවක් පිහිටුවීම සඳහා අවසර දෙන ලදී. 1987 වර්ෂය අවසාන වනවිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ මුළු වාණිජ බැංකු සංඛ්‍යාව 24 ක් වූ අතර ඉන් 19 ක් විදේශීය බැංකුද, 5 ක් දේශීය බැංකුද විය.

ශාඛා බැංකු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සලකා බලන කල, 1987 දී විවෘත කරන ලද මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 5 ක් වූ අතර, ඉන් තුනක් රාජ්‍ය අංශයේ බැංකු දෙක සතු විය. ලංකා බැංකුව විසින් ගලේවෙල නගරයේ නව ශාඛාවක් විවෘත කරනු ලැබූ අතර එහි රිකිල්ලගස්කඩ කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛාව ප්‍රධාන ශාඛාවක තත්ත්වයට උසස් කරන ලදී. ලංකා බැංකුවේ ඕරුවල ශාඛාව කඩුවෙල ශාඛාව සමග ඒකාබද්ධ කරන ලද හෙයින් ඕරුවල ශාඛාව 1987 අගෝස්තු මස 7 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වසා දමන ලදී. ඒ අනුව, 1986 වර්ෂය අවසාන වන විට 238 ක්ව පැවති ලංකා බැංකුවේ ප්‍රධාන ශාඛා සංඛ්‍යාව 1987 වර්ෂය අවසානය වනවිට 239 දක්වා වැඩි විය. මහජන බැංකුව 1987 ජනවාරි මාසයේදී රත්නපුර නගරයේ නව ශාඛාවක් විවෘත කරන ලද හෙයින් එහි මුළු ශාඛා සංඛ්‍යාව 298 දක්වා වැඩි විය. 1987 දී දේශීය පෞද්ගලික බැංකු විසින් පිහිටුවන ලද ශාඛා දෙක කොළඹ 10 පිහිටි සීමාසහිත සම්පත් බැංකුවේ ප්‍රධාන ශාඛා කාර්යාලයෙන්ද, හැටන් නැෂනල් බැංකුවේ කළුතර ශාඛාවෙන්ද සමන්විත විය. නව ශාඛා පිහිටුවීම සහ පවත්නා ශාඛා ඒකාබද්ධ කිරීම මගින් ඇති කරන ලද වෙනස්කම් අනුව වාණිජ බැංකුවල මුළු ප්‍රධාන ශාඛා සංඛ්‍යාව 1986 අවසානයේදී 604 සිට 1987 අවසානයේදී 608 දක්වා වැඩි විය.

1987 වර්ෂය තුළදී කෑගල්ල, පුත්තලම, ගාල්ල සහ මහනුවර යන දිස්ත්‍රික්කයන්හි තවත් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 4 ක් පිහිටුවීම නිසා වර්ෂය අවසානය වනවිට මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 9 ක් විය. විමර්ශනයට ලක්ව ඇති වර්ෂය තුළදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා සංඛ්‍යාව 29 කින් වැඩිව වර්ෂය අවසානය වනවිට ශාඛා 61 ක් විය.

බොරැල්ල හා හක්මන නව ශාඛා දෙකක් විවෘත කිරීමෙන් පසු 1987 අවසානය වනවිට මුළු ශාඛා සංඛ්‍යාව 62 ක්ව පැවති ජාතික ඉතිරි කිරීමේ බැංකුව ද මෙරට බැංකු පද්ධතියේ ව්‍යාප්තියට දායක විය.

චෙක්පත්වල නිෂ්කාශණ කටයුතු වේගවත් කිරීම පිණිස ස්වයංක්‍රිය චෙක්පත් නිෂ්කාශණ ක්‍රමය සඳහා අවශ්‍ය වූ උපකරණ සවි කිරීම, අතිරේක සේවක පිරිසක් බඳවා ගැනීම වැනි කටයුතු නිම කිරීමෙන් ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු සේවාවන් නවීකරණය කිරීමේ ප්‍රතිපත්තිය මහ බැංකුව විසින් තවදුරටත් අනුගමනය කරන ලදී.

## බැංකු අධීක්ෂණය

### වාණිජ බැංකු

1986 දී ආරම්භ කරන ලද වාණිජ බැංකු හතක පරීක්ෂණ කටයුතු 1987 දී අවසන් කරන ලදී. 1987 දී බැංකු අටක (ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ඇතුළුව) පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලද අතර, ඉන් තුනක පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත. 1986/87 පරීක්ෂණ කාලසීමාව 1988 දක්වා වර්ෂයකින් දීර්ඝ කරන ලදී. වාණිජ බැංකු විසින් මාසිකව ඉදිරිපත් කරනු ලබන වත්කම් හා වගකීම් ප්‍රකාශනයන් පදනම් කරගෙන ඒවායේ මූල්‍ය තත්ත්වයන් පරීක්ෂා කිරීම මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. වාණිජ බැංකු විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පදනම් කරගෙන ඒවායේ 1986 වසරේ ලාභදායිතාවය විග්‍රහ කර බැලීමද සිදු විය. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විදේශ බැංකු විසින් ඒවායේ සේවකයින් සඳහා සළසන ලද පුහුණු කිරීම් පිළිබඳවද අර්ධ වාර්ෂික පදනමක් මත පරීක්ෂා කරන ලදී.

ක්‍රියාත්මක නොවන අත්තිකාරම් සාමාන්‍ය අත්තිකාරම්වලින් වෙන් කිරීම සහ එබඳු අත්තිකාරම් සඳහා එකතු වූ පොළිය ලාභයට ඇතුලත් කිරීම පිළිබඳව උපදෙස් දෙමින් 1987 දී නියෝගයක් නිකුත් කරන ලදී. මෙමගින් වාණිජ බැංකුවල මූල්‍ය තත්ත්වය සහ ලාභදායිතාවය වඩාත් නිවැරදි ලෙස පරීක්ෂා කිරීම පහසු කෙරෙනු ඇත.

විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය යටතේ වාණිජ බැංකු විසින් ආරම්භ කරන ලද විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි ගණුදෙනු පිළිබඳව පරීක්ෂාකාරීව සිටීමේ වැඩ පිළිවෙලෙහි මහ බැංකුව තවදුරටත් නිරත වුණි.

මහ බැංකුව විසින් 1987 දී වාණිජ බැංකු, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ සමූපකාර ග්‍රාමීය බැංකුවල තැන්පතු රක්ෂණය කිරීමේ යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී.

**මූල්‍ය සමාගම්**

1987 දෙසැම්බර් මස 31 වැනි දිනට මහ බැංකුවෙහි ලියාපදිංචි කරන ලද මුළු මූල්‍ය සමාගම් සංඛ්‍යාව 71 ක් විය. විමර්ශනයට ලක්ව ඇති වර්ෂය තුළදී ලියාපදිංචි කිරීම සඳහා වූ අයදුම්පත් පහක් මහ බැංකුව වෙත ලැබී ඇත. එසේ වුවද, 1979 අංක 27 දරණ මූල්‍ය සමාගම් පාලනය කිරීමේ පනතෙහි (මූ.ස.පා.ප.) විධිවිධානවලට අනුකූල නොවීම නිසා සමාගම් දෙකක අයදුම්පත් ප්‍රතික්ෂේප කරන ලද අතර, එක් සමාගමක් පමණක් ලියාපදිංචි කරන ලදී.

මූ.ස.පා. පනතෙහි විග්‍රහ කර ඇති කොන්දේසිවලට අනුකූලව ව්‍යාපාරික කටයුතු නොකිරීම නිසා මහ බැංකුවෙහි ලියාපදිංචි කර ඇති මූල්‍ය සමාගම් දෙකකට නිකුත් කර ඇති බලපත් අවලංගු කර ඇත. මුදල් මණ්ඩලය විසින් සමාගම් හයක ව්‍යාපාරික කටයුතු අත්හිටුවීම අනුමත කළද, විශේෂයෙන් නියම කළ තත්ත්වයන් හා කොන්දේසි යටතේ යළි ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට සමාගම් පහකට අවසර දෙන ලදී. ඉතිරි සමාගම ඇවර කිරීම සඳහා උසාවිය වෙත අයදුම්පතක් ඉදිරිපත් කර ඇත. මුදල් මණ්ඩලය විසින් දෙන ලද කොන්දේසි උල්ලංඝනය කිරීම නිසා මහ බැංකුව විසින් සමහර මූල්‍ය සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව නීති මඟින් කටයුතු කිරීම සඳහාද අවශ්‍ය මූලික පියවරයන් ගන්නා ලදී.

විමර්ශණයට ලක්ව ඇති වර්ෂය තුළදී මූ.ස.පා. පනතේ 15 (1) වගන්තිය යටතේ මූල්‍ය සමාගම් 42 ක් පරීක්ෂාවට භාජනය විණි. අවශ්‍ය ප්‍රාග්ධන අරමුදල් සහ ද්‍රවශීල වත්කම් මට්ටම් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් දෙන ලද නියෝගවලට අනුකූලතාවය දැක්වීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මූල්‍ය සමාගම් විසින් සපයන ලද මාසික වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශන සහ වාර්ෂික ලාභාලාභ ගිණුම්ද, ශේෂ පත්‍රයන්ද පරීක්ෂා කරන ලදී.

1987 දෙසැම්බර් මාසයේදී මහ බැංකුව විසින් මූල්‍ය සමාගම් අය කරන පොළී අනුපාතිකයන් සහ අනෙකුත් ගාස්තු පිළිබඳව සීමා පනවමින් නියෝග නිකුත් කරන ලදී. මෙම නියෝගවලට අනුව මාස 12 කට නොවැඩි කල්පිරීමේ කාලසීමාවකින් යුතු තැන්පතු සඳහා ගෙවිය හැකි උපරිම පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 17 ක් වශයෙන් නියම විණි. මාස 12 කට වැඩි කල් පිරීමේ කාලසීමාවක් ඇති තැන්පතු සඳහා ගෙවිය හැකි උපරිම පොළිය වර්ෂයකට සියයට 18 කට සීමා කරන ලදී. මෙම නියෝගවලට අනුව මූල්‍ය සමාගම්වල සියළුම ණය සහ අත්තිකාරම්වලට පොළී අය කළ හැක්කේ හීනවන ශේෂය මතය. තවද, මෙම නියෝග අනුව මූල්‍ය සමාගම් මගින් අත්තිකාරම් සහ ණය දීමේදී මුල් මුදල, පොළිය හෝ වෙනත් ගාස්තු ආපසු ගෙවීම් සම්බන්ධ කිසිම මුදලක් අඩු නො කළ යුතුය.

1987 පෙබරවාරි මාසයේදී කොළඹ දිස්ත්‍රික් උසාවිය මගින් ගන්නා ලද තීරණයක් අනුව බුන්වත් තත්ත්වයට පත්ව තිබූ සීමාසහිත සෙවන මූල්‍ය හා ආයෝජන සමාගම ඇවර කිරීම සඳහා මහ බැංකුව විසින් මූලික පියවරයන් ගන්නා ලදී.

## සංවර්ධන මුදල්

1987 වසර තුළදී මහ බැංකුව විසින් කර්මාන්ත, කෘෂිකර්මය සහ සේවාවන් සඳහා වූ සිය මැදි හා දිගුකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීම සම්බන්ධ වැඩ කටයුතු නොකඩවා කරගෙන යන ලදී. එසේ වුවද, 1987 දී මැදි හා දිගුකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීමට වඩා ව්‍යවසායකත්වය නංවාලීම සහ දුර්වල කර්මාන්ත පුනරුත්ථාපනය කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කෙරුණි. සංචාරක හෝටල් අංශයට සලසන ලද සහන සමුදය ක්‍රියාත්මක කිරීමද මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත (සු. ම. ක.) – II ණය සහතික කිරීමේ ක්‍රමය යටතේ වූ ගෙවීම් 1987 දී අවසන් වීමට නියමිතව තිබූ නිසා වර්ෂය අවසානය ළංවන විට එහි කටයුතු වඩාත් වේගවත් විය.

පාසැල් අත්හැර යන්නන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩපිළිවෙල, ව්‍යවසායකයින් විය හැකි අය සහ දැනට සිටින ව්‍යවසායකයින්ගේ තාක්ෂණික හා කළමනාකරණ දැනුම වැඩි දියුණු කිරීම සඳහා වූ වැඩපිළිවෙල යන ප්‍රධාන අංශ තුනකින් සමන්විත වූ සිය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන මහ බැංකුව විසින් 1987 ජනවාරි මාසයේදී ආරම්භ කරන ලදී. පළමු වැඩසටහන 1987 පෙබරවාරි මස හෙට්ටිමුල්ලේදී පවත්වන ලද අතර, ඉන්පසුව හලාවත, මහනුවර, ගාල්ල, කුලියාපිටිය සහ ගිරාඳුරුකෝට්ටේ යන ස්ථානයන්හි තවත් වැඩසටහන් පහක් පවත්වන ලදී. මේ යටතේ පාසැල් අත්හැර යන්නන් සඳහා වැඩසටහන් හතරක්ද, කළමනාකරණය නංවාලීම අරමුණු කර ගත් වැඩසටහන් දෙකක්ද විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදි හා දිගුකාලීන ණය අරමුදලේ කාණ්ඩ II, III හා IV යටතේ 1987 දී අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 134.7 ක් විය. මෙය ඉකුත් වසරේ අනුමත කරන ලද රුපියල් දශ ලක්ෂ 442.8 හා සසඳා බලන කල සැළකිය යුතු අඩු වීමකි. මෙම අඩු වීමට වැඩි වශයෙන්ම හේතු වූයේ සංචාරක අංශයේ හෝටල් පුනරුත්ථාපනය සඳහා අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය පහත් මට්ටමකට වැටීමය. අපනයන සහ කෘෂිකර්ම අංශයන් සඳහා වූ ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් 1986 මට්ටමට වඩා පහත්ව පැවති අතර, එය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 25.8 ක් හා රුපියල් දශ ලක්ෂ 23.0 ක් විය. අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණයන්හි විස්තරයක් 2.3 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

### 2.3 සංඛ්‍යා සටහන
### මැදි හා දිගු කාලීන ණය අරමුදල
### (කාණ්ඩ II – IV ප්‍රතිමූල්‍ය අනුමත කිරීම්)

රුපියල් දශ ලක්ෂ

| කාණ්ඩය | 1985 | | 1986 | | 1987 | |
|---|---|---|---|---|---|---|
| | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය |
| II අපනයන අංශය .. | 13·7 | 9·0 | 41·4 | 29·0 | 36·9 | 25·8 |
| III සහ IV | | | | | | |
| (i) කෘෂිකර්මය .. | 2·6 | 1·6 | 134·4 (අ) | 80·6 | 38·3 (ආ) | 23·0 |
| (ii) කර්මාන්ත .. | 38·9 | 27·2 | 1·0 | 0·6 | 2·5 | 1·5 |
| (iii) හෝටල් .. | — | — | 2·5 | 1·5 | — | — |
| (iv) අනෙකුත් .. | 6·5 | 3·9 | 16·5 | 14·7 | 52·0 | 31·2 |
| අඩාල වූ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීම .. | 145·5 | 101·9 | 325·6 (ඇ) | 316·4 | 84·8 (ඈ) | 53·2 |
| එකතුව .. | 207·2 | 143·6 | 521·4 | 442·8 | 214·5 | 134·7 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) මැදිකාලීන ආයෝජන වැඩ සටහන යටතේ වැවිලි කර්මාන්ත ව්‍යාපෘති සඳහා දෙන ලද සමස්ත අගය රුපියල් දශ ලක්ෂ 130·4 ක් වූ ණය මුදල් 5 ක්ද ඇතුළත්ය.

(ආ) මැදි කාලීන ආයෝජන වැඩ සටහන යටතේ වැවිලි කර්මාන්ත ව්‍යාපෘති සඳහා අනුමත කරන ලද ණය මුදල් 2 ක්ද ඇතුළත්ය.

(ඇ) සංචාරක හෝටල්වලට දෙන ලද රුපියල් දශ ලක්ෂ 40·9 ක ණය ප්‍රමාණයක් මත හිඟ හිට ඇති පොළිය ප්‍රාග්ධනගත කිරීමද ඇතුළත්ය.

(ඈ) සංචාරක හෝටල් ව්‍යාපෘතීන් 39 ක් සඳහා දෙන ලද ණය මුදල් සඳහා හිඟ හිට ඇති පොළිය ප්‍රාග්ධනගත කිරීමද ඇතුළත්ය.

සංචාරක හෝටල් සඳහා වූ සහන සමුදය 1987 දීද ක්‍රියාත්මක විණි. හෝටල් වැඩි ප්‍රමාණයක්ම 1985 සහ 1986 වර්ෂයන්හි දී මෙම සහන ප්‍රයෝජනයට ගත් හෙයින් 1987 දී ප්‍රතිලේඛනගත කිරීම සඳහා වූ ඉල්ලීම් සාපේක්ෂ වශයෙන් පහත් මට්ටමක පැවතිණි. 1987 දී මෙම යෝජනා ක්‍රමය යටතේ වූ ආධාර, හෝටල් ව්‍යාපෘතීන් 39 ක් සම්බන්ධයෙන් දෙන ලද ණය සඳහා වූ හිඟ හිටි පොළී මුදල් ප්‍රාග්ධනගත කිරීමට සීමා විය.

## 2 . 4 සංඛ්‍යා සටහන

### සංචාරක කර්මාන්තයට සහන සැලසීම – ණය මුදල් ප්‍රතිලේඛනගත කිරීම

(1987 දෙසැම්බර් දක්වා සමුච්චිත එකතුව)

| ණය දුන් ආයතනයේ නම | නිම කරන ලද ප්‍රතිලේඛනගත කිරීම් | | සළකා බැලෙමින් පවතින ප්‍රතිලේඛනගත කිරීම් | | මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍යනය කරන ලද හිඟ හිටි පොළිය |
|---|---|---|---|---|---|
| | හෝටල් සංඛ්‍යාව | ණය ප්‍රමාණය (රුපියල්) | හෝටල් සංඛ්‍යාව | ණය ප්‍රමාණය (රුපියල්) | ප්‍රමාණය (රුපියල්) |
| ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය .. | 25 | 155,238,020 | — | — | 84,815,390 |
| ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව .. | 13 | 157,122,465 | — | — | 88,952,009 |
| මහජන බැංකුව .. | 16 | 95,176,179 | 16 | 77,069,527 | 1,958,869 |
| ලංකා බැංකුව .. | 10 | 58,980,375 | 13 | 55,490,099 | 881,554 |
| සීමාසහිත හැටන් නැෂනල් බැංකුව .. | 5 | 12,243,951 | 2 | 2,134,822 | 11,678,619 |
| සීමාසහිත ලංකා වාණිජ බැංකුව .. | 7 | 35,295,999 | 6 | 6,335,209 | 11,266,907 |
| ග්‍රින්ඩ්ලේස් බැංකුව .. | — | — | 2 | 7,525,856 | — |
| ඩොයිෂ් බැන්ක් (ආසියා) ඒ. ජී. .. | 1 | 3,059,256 | — | — | 1,833,943 |
| එකතුව .. | 77 | 517,116,245 | 39 | 148,555,513 | 201,387,291 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

**ණය සහතික කටයුතු**

මහ බැංකුව විසින් පාලනය කෙරෙන ණය සහතික යෝජනා ක්‍රම තුන යටතේ වූ ණය සහතික කටයුතුවල සාරාංශයක් 2.5 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි. ක)**

මහ බැංකුව විසින් රජය වෙනුවෙන් සු. පරි. ක. ණය සහතික යෝජනා ක්‍රමය 1978 දී ආරම්භ කරන ලද අතර මෙම යෝජනා ක්‍රමය යටතේ ණය සහතික නිකුත් කිරීම 1981 වර්ෂය අගදී අවසන් කරන ලදී. අදළ කාල පරිච්ඡේදය තුළදී මහ බැංකුව විසින් සහතික කරන ලද මුළු ණය සංඛ්‍යාව 767 ක් වූ අතර එහි වටිනාකම රුපියල් දශ ලක්ෂ 31.2 ක් විය. මින් 1987 වර්ෂය ආරම්භයේ රුපියල් දශ ලක්ෂ 2.5 ක ශේෂයකින් යුතු ණය 108 ක් නොපියවා පැවති අතර ඉන් 16 ක් වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කරන ලදී. 1987 වර්ෂයේදී එක්

## 2.5 සංඛ්‍යා සටහන

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික ක්‍රම (1986 – 1987)

## (1987 දෙසැම්බර් 31 දිනට)

(ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ)

| ශීර්ෂය | සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි. ක.) | | | | සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සු.ම.ක – I | | | | සු.ම.ක – II | | | |
| | 1986 | | 1987 | | 1986 | | 1987 | | 1986 | | 1987 | |
| | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය |
| අනුමත කරන ලද ණය .. | 767 | 31·2 | 767 | 31·2 | 1,668 | 286·1 | 1,668 | 286·1 | 1,540 | 782·7 | 2,182(ඉ) | 1,148.06 |
| සහතික කරන ලද ණය .. | 767 | 23·4(අ) | 767 | 23·4(අ) | 1,668 | 157·5(ඇ) | 1,668 | 157·5(ඇ) | 1,540 | 406·9(ඈ) | 2,182(ඉ) | 593.07(ඈ) |
| සම්පූර්ණයෙන් ගෙවා නිමි ණය .. | 545 | 19·4 | 561 | 20·5 | 913 | 89·4 | 1,003 | 112·3 | 56 | 8·66 | 67 | 11·28 |
| ඉවත්කර ගන්නා ලද/අහෝසි වූ ණය සහතික | 62 | 3·6 | 63 | 3·9 | 48 | 12·8 | 48 | 12·8 | 50 | 30·33 | 62 | 35·87 |
| පිළිගන්නා ලද/පියවන ලද හිමිකම් පෑම් | | | | | | | | | | | | |
| (i) නොපියවන ලද ණය මුදල් .. | 50 | 2·067 | 55 | 2·203 | 123 | 15·900 | 150 | 19·143 | 1 | 0·060 | 7 | 2·055 |
| (ii) පිළිගන්නා ලද වගකීම් .. | 50 | 1·550 | 55 | 1·652 | 123 | 9·541 | 150 | 11·486 | 1 | 0·036 | 7 | 1·233 |
| ප්‍රතික්ෂේප කළ හිමිකම් පෑම් | | | | | | | | | | | | |
| (i) නොපියවන ලද ණය මුදල් .. | 2 | 0·22 | 2 | 0·22 | 13 | 4·05 | 15 | 4·98 | 2 | 0·17 | 4 | 0·17 |
| (ii) හිමිකම් පෑ ප්‍රමාණය .. | 2 | 0·16 | 2 | 0·16 | 13 | 2·42 | 15 | 2·99 | 2 | 0·1 | 4 | 0·1 |
| නොපියවන ලද ණය මුදල් .. | 108 | 2·5(ආ) | 86 | 2·2(ආ) | 571 | 76·8(ආ) | 452 | 63·9(ආ) | 1,431 | 490·0(ආ) | 1,692 | 687·22(ආ) |
| (එයින් හිඟ හිටි ණය) .. | 105 | (2·4) | 78 | (1·3) | 387 | (48·6) | 354 | (48·7) | 197 | (59·1) | 327 | (122·05) |
| නොපියවන ලද ණය සහතික .. | 108 | 1·9(අ) | 86 | 1·6(අ) | 571 | 44·1(ඇ) | 452 | 36·8(ඇ) | 1,431 | 260·0(ඈ) | 1,692 | 375·41(ඈ) |
| (i) කල් දමන ලද හිමිකම් පෑම් .. | 6 | 0·527 | 4 | 0·438 | 33 | 8·827 | 36 | 10·492 | 4 | 0·890 | 5 | 1·369 |
| (ii) සලකා බැලෙමින් ඇති හිමිකම් පෑම් | 4 | 0·158 | 3 | 0·030 | 49 | 7·601 | 52 | 7·113 | 8 | 3·436 | 18 | 7·283 |
| (ii.i) හිමිකම් පෑ වගකීම් .. | 4 | 0·119 | 3 | 0·023 | 49 | 4·561 | 52 | 4·268 | 8 | 2·062 | 18 | 4·370 |
| රැස් කරන ලද ඇප වාරික මුදල් .. | | 0·89 | | 0·91 | | 8·69 | | 10·60 | | 3·39 | | 8·08 |

(අ ) නොපියවූ ණය වලින් සියයට 75 ක ප්‍රමාණය.

(ආ) අය කර ගත් ණය වාරික හැර.

(ඇ) රුපියල් ලක්ෂ 4 ක උපරිමයකට යටත්ව නොපියවා ඇති ණය වලින් සියයට 60 ක ප්‍රමාණය.

(ඈ) රුපියල් දශ ලක්ෂ 2·0 සිට රුපියල් දශ ලක්ෂ 4·0 දක්වා ණය මුදල් සම්බන්ධයෙන් රුපියල් දශ ලක්ෂ 1·2 ක හා රුපියල් දශ ලක්ෂ 2·0 දක්වා ණය මුදල් සම්බන්ධයෙන් රුපියල් ලක්ෂ 8 ක උපරිමයකට යටත්ව නොපියවා ඇති ණය වලින් සියයට 60 ක ප්‍රමාණය.

(ඉ) 1987. 12. 31 වන දිනට මුද හැර ඇති බවට වාර්තා වී නොමැති රුපියල් දශ ලක්ෂ 227 ක මුදලක් සඳහා වූ ණය 350 ක් ඇතුළත්ය.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සහතික කිරීමක් ඉවත්කර ගන්නා ලද අතර, සහතික කිරීම් පහක් යටතේ වූ හිමිකම් පෑම් පියවන ලද හෙයින් රුපියල් දශ ලක්ෂ 2.2 ක ශේෂයකින් යුතු ණය සහතික 86 ක සංඛ්‍යාවක් වර්ෂය අවසාන වන විට නොපියවා පැවතිණි. මින් අටක් හැර සෑම ණයක්ම හිඟ හිටි ණය වන අතර ඉල්ලීම් ඉදිරිපත් කරන ලද්දේ ඒ අට සම්බන්ධයෙන් පමණි. රජයේ අයවැය ලේඛනය මගින් මේ සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රයෝජනයට ගනිමින් වර්ෂය අවසානයේදී මහ බැංකුව විසින් මෙම යෝජනා ක්‍රමයට සහභාගී වන ණය ආයතන දෙක වන මහජන බැංකුව සහ ලංකා බැංකුව සඳහා රුපියල් දශ ලක්ෂ 1.7 ක් ගෙවීමෙන් මුළු හිමිකම් පෑම් 55 ක් පියවා ඇත. වර්ෂය අවසාන වන විට හිමිකම්පෑම් හතක් පමණක් ගෙවීමට බලාපොරොත්තුවෙන් සිටි අතර මෙයින් තුනක් ණය ගැනුම්කරුවන් විසින් කලින් ගන්නා ලද ණය ආපසු ගෙවනු ලබමින් සිටි නිසා පමා කරන ලද අතර, අනෙක් හතර සහභාගී වන ආයතනයන් වෙතින් විමසා ඇති විස්තර සපයනු නොලැබීම නිසා නොගෙවා පැවතිණි. මෙම යෝජනා ක්‍රමය යටතේ 1987 අවසානය දක්වා මහ බැංකුව විසින් වාර මුදල් වශයෙන්, සහභාගිවන ණය ආයතනයන්ගෙන් එකතු කරන ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 0.91 ක් විය.

**සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත (සු. ම. ක.—I) යෝජනා ක්‍රමය—I**

සු.ම.ක.—I ණය සහතික යෝජනා ක්‍රමය යටතේ මහ බැංකුව විසින් 1979 සහ 1984 අතර කාලය තුළදී නිකුත් කරන ලද මුළු ණය සහතික සංඛ්‍යාව 1,668 ක් වූ අතර 1987 අවසානය වනවිට මේවායින් රුපියල් දශ ලක්ෂ 63.9 ක ශේෂයකින් යුතු 452 ක ණය සංඛ්‍යාවක් නොපියවා ඉතිරිව පැවතිණි. විමර්ශනයට ලක්ව ඇති වර්ෂය තුළදී ණය 90 ක් මුළුමණින්ම අය කර ගන්නා ලද අතර හිමිකම්පෑම් 27 ක් පියවන ලදී.

වර්ෂය අවසන් වනවිට පැහැර හැරි ණය සංඛ්‍යාව 354 ක් වූ අතර එහි වටිනාකම රුපියල් දශ ලක්ෂ 48.7 ක් විය. 1987 අවසානය වනවිට මහ බැංකුව විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ වූ හිමිකම් පෑම් 150 ක් පියවනු ලැබීම සඳහා ඊට සහභාගී වන ණය ආයතන හතර වෙත රුපියල් දශ ලක්ෂ 11.5 ක මුළු මුදලක් ගෙවන ලදී. ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 2.0 ක් වටිනා හිමිකම්පෑම් 2 ක් ප්‍රතික්ෂේප කරනු ලැබීම නිසා ප්‍රතික්ෂේප කරන ලද මුළු හිමිකම්පෑම් සංඛ්‍යාව 15 දක්වා වැඩි විය. වර්ෂය අවසානය වනවිට ගෙවනු ලැබීම සඳහා පිළිගැනීමට බලාපොරොත්තුව සිටි හිමිකම්පෑම් 52 ක් වූ අතර ඒවායේ වගකීම් වටිනාකම රුපියල් දශ ලක්ෂ 4.3 ක් විය. මෙම යෝජනා ක්‍රමය යටතේ වර්ෂය අවසාන වනවිට වාර මුදල් වශයෙන් එකතු කරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 10.6 ක් විය.

**සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත (සු. ම. ක.—II) යෝජනා ක්‍රමය—II**

සු. ම. ක.—II ණය සහතික යෝජනා ක්‍රමය 1982 දී ආරම්භ විය. මෙම යෝජනා ක්‍රමය යටතේ ණය දීම 1987 දී අවසන් කිරීමට නියමිතව තිබූ නිසා ඊට සහභාගිවන ණය දෙන ආයතන විසින් සිය ණය දීමේ කටයුතු කඩිනම් කරන ලදී. ඒ නිසා වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 365.4 ක ණය වටිනාකමකින් යුතු ණය සහතික ඉල්ලුම් පත් සංඛ්‍යාව 642 කින් වැඩිවීමෙන් සු.ම.ක.—II යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ලද මුළු ණය සහතික සංඛ්‍යාව 2,182 දක්වා ඉහළ නැඟුණි. වර්ෂය අවසාන වනවිට මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 11.3 ක් වූ ණය 67 ක සංඛ්‍යාවක් සම්පූර්ණයෙන්ම අය කර ගන්නා ලද අතර නොපියවා පැවති ණය 1,692 ක සංඛ්‍යාවෙන් රුපියල් දශ ලක්ෂ 122.05 ක ණය ශේෂයකින් යුතු ණය 327 ක සංඛ්‍යාවක් හිඟ හිටි ණය බවට පත්ව ඇත. 1987 අවසානය වනවිට මහ බැංකුව විසින් රුපියල්

දශ ලක්ෂ 1.2 ක්, සහභාගි වන ණය ආයතනයන් 5 ක් වෙත ගෙවනු ලැබීමෙන් මෙම යෝජනා ක්‍රමය යටතේ හිමිකම්පෑම් 7 ක් පියවා ඇත. සු.ම.ක.—II යටතේ නොපියවා පැවති ණය 1,692 ක සංඛ්‍යාවෙන් රුපියල් දශ ලක්ෂ 122.0 ක ණය වටිනාකමකින් සහ රුපියල් දශ ලක්ෂ 73.0 ක සහතික වටිනාකමකින් යුතු ණය 327 ක සංඛ්‍යාවක් හිභ හිටි ණය බවට පත්ව ඇත. මෙමගින් මෙම යෝජනා ක්‍රමය යටතේ මහ බැංකුවේ උපරිම වගකීම නියෝජනය කෙරේ. මෙම යෝජනා ක්‍රමයෙන් වාරික වශයෙන් එකතු කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ 8 ක් විය. සු.ම.ක.—II යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණය, කර්මාන්ත අනුව වර්ග කර 2.6 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

### 2.6 සංඛ්‍යා සටහන

### සු.ම.ක. - I යෝජනා ක්‍රමය – කර්මාන්ත අනුව ණය වර්ගීකරණය

(ප්‍රමාණය රුපියල් දහස් ගණනින්)

| කර්මාන්තය | 1982–1987 | | | 1987 | | |
|---|---|---|---|---|---|---|
| | ණය මුදල් සංඛ්‍යාව | අනුමත කළ ප්‍රමාණය | සහතික කළ ප්‍රමාණය | ණය මුදල් සංඛ්‍යාව | අනුමත කළ ප්‍රමාණය | සහතික කළ ප්‍රමාණය |
| ආහාර වර්ග සැකසීම .. | 714 | 371,953 | 189,911 | 223 | 114,278 | 57,411 |
| වෙනත් කෘෂි කර්මාන්ත .. | 45 | 18,903 | 10,222 | 10 | 4,290 | 2,574 |
| රබර් නිෂ්පාදන .. | 67 | 49,671 | 24,923 | 11 | 11,205 | 4,963 |
| ලෝහ නිෂ්පාදන .. | 216 | 93,781 | 48,119 | 60 | 29,651 | 15,430 |
| ඉදිකිරීම් ද්‍රව්‍ය .. | 142 | 80,709 | 44,031 | 37 | 19,588 | 11,193 |
| ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු .. | 19 | 25,400 | 12,320 | 11 | 13,325 | 6,535 |
| දැව නිෂ්පාදන .. | 150 | 50,674 | 28,249 | 37 | 13,379 | 7,627 |
| ඇහළුම් .. | 111 | 48,155 | 25,368 | 24 | 17,013 | 7,900 |
| රෙදිපිළි .. | 50 | 39,613 | 20,625 | 18 | 19,257 | 9,357 |
| අළුත්වැඩියා කිරීමේ වැඩපලවල් .. | 85 | 32,126 | 1,849 | 22 | 7,471 | 4,483 |
| විවිධ .. | 583 | 337,074 | 170,456 | 189 | 117,444 | 59,300 |
| එකතුව .. | 2,182 | 1,148,059 | 593,073 | 642 | 366,901 | 186,773 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

### පසු විපරම් කිරීම සහ ව්‍යාපෘති පරීක්ෂණය

ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වීමේ මට්ටම් නිගමනය කිරීම සඳහා මැදි හා දිගුකාලීන ණය අරමුදල සහ සු.ම.ක. යෝජනා ක්‍රමයන් යටතේ මුදල් සපයන ලද ව්‍යාපෘතීන් පරීක්ෂා කිරීම සහ පසු විපරම් කිරීම 1987 දීද නොකඩවා කරගෙන යන ලදී. පසු විපරම් කටයුතු නිසා, අවශ්‍ය තැන්වලදී ගත යුතු නිවැරදි ක්‍රියා මාර්ගයන් හඳුනා ගැනීමට මහ බැංකුවට හැකි විය. 1987 වසර තුළදී පරීක්ෂාවට භාජනය කරන ලද සු.ම.ක. ව්‍යාපෘතීන් 87 න් වැඩි කොටසක් වූයේ කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කයන්හිය.

### ග්‍රාමීය ණය

පසුගිය වර්ෂයේ මෙන් මෙරට ග්‍රාමීය ණය කටයුතු නංවාලීම සඳහා මහ බැංකුව ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කළේය. ජාතික වශයෙන් අනුගමනය කළයුතු ප්‍රතිපත්තිමය මග පෙන්වීම් පිළියෙල කිරීම, ණය යෝජනා ක්‍රම සකස් කිරීම, ණය යෝජනා ක්‍රම පිළිබඳව පරීක්ෂාකාරීවීම, අධීක්ෂණය හා ඇගැයීම සහ සාර්ථක ග්‍රාමීය ණය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනික පොදු කාර්ය පහසුකම් නංවාලීම හා සංවර්ධනය වැනි කාර්යයන් මහ බැංකුවේ කටයුතුවලට අයත් විය.

1987 දී ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය විසින් රැස්වීම් පහක් පැවැත්විය. පළමුවරට මණ්ඩලය කොළඹින් පිටත රැස්වීමක් පැවැත්වූ අතර එය සංචාරය සඳහා පැමිණෙන විට දැඩි නියඟයකට හසුව පැවති පුත්තලම දිස්ත්‍රික්කයේ නිකවැරටිය ඡන්ද කොට්ඨාශයෙහි සංචාරයක් හා සම්බන්ධ විය. විවිධ ස්ථානයන්හි දී ගොවීන් හමු වූ මණ්ඩලය ඔවුන්ගේ, ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කළාය. මණ්ඩලයේ රැස්වීම්වලදී මෙරට ග්‍රාමීය ණය කටයුතු නංවාලීම හා සම්බන්ධ වැදගත් කරුණු කිහිපයක් සාකච්ඡා විය. මණ්ඩලයේ අවධානයට ලක් වූ එක් අංශයක් නම් මිළ ගණන්වල අක්‍රමවත් හැසිරීම නිසා දැඩි අසීරුකම්වලට මුහුණ පා සිටි තේ අංශයට, විශේෂයෙන්ම කුඩා තේ ඉඩම් හිමියන් සහ පෞද්ගලික තේ කම්හල් හිමියන්ට ණය සැපයීමය. මෙම අංශයට විශේෂ ආධාර සැපයීමේ අවශ්‍යතාවය මණ්ඩලය ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත් අතර, මණ්ඩලය විසින් තේ අංශය සඳහා විධිමත් ණය යෝජනා ක්‍රමයක් සකස් කරන මෙන් මහ බැංකුවෙන් ඉල්ලා සිටින ලදී.

වර්ෂය තුළදී මණ්ඩලය විසින් ජාතික විදුලිබල සම්පාදනයෙන් විදුලිය නොලැබෙන මෙරට දුර බැහැර ප්‍රදේශවල යහපත සඳහා ග්‍රාමීය විදුලි බලය සැපයීමේදී සූර්ය බලශක්ති ඒකකයන්හි භාවිතය ජනප්‍රිය කිරීම සඳහා ණය යෝජනා ක්‍රමයක් සළකා බලන ලද අතර, සතුන්ගේ තත්ත්වය උසස් කිරීම සඳහා සේවා ගොවිපලවල් පිහිටුවීම මගින් කළුතර දිස්ත්‍රික්කයේ කිරි පට්ටි පාලන කර්මාන්තය නංවාලීම සඳහා වැඩපිළිවෙලක්ද සාකච්ඡා කරන ලදී. 1987 දී මණ්ඩලයේ අවධානය යොමු වූ තවත් කරුණක් වූයේ කිරි නිපදවන්නන්ට දිරි ගැන්වීම් සලසන මෙන් අනුරාධපුර කිරි නිපදවන්නන්ගේ සංගමයෙන් කළ ඉල්ලීමය. තවද, සෙවනගල උක් වගාකරුවනට ණය සැපයීම සඳහා වූ යෝජනා ක්‍රමය සහ ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය මගින් මිළදී ගන්නා සෝයා බෝංචි, බඩ ඉරිඟු හා අනෙකුත් ධාන්‍ය වර්ග මිළදී ගැනීම සඳහා ණය පහසුකම් නංවාලීමේ යෝජනා ක්‍රමයක්ද මණ්ඩලයේ විමසුමට ලක් විය.

1987 නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍ර.) ක්‍රියාත්මක කිරීම මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. 1986 යල කන්නයේදී දෙන ලද රුපියල් දශ ලක්ෂ 151 හා සසඳා බලන කල, 1987 යල කන්නයේදී න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය යටතේ දෙන ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 124 ක් විය. 1985/86 මහ කන්නයේදී දෙන ලද රුපියල් දශ ලක්ෂ 116 හා සසඳා බලන කල 1986/87 මහ කන්නයේ දෙන ලද මුළු ණයවල වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 257 සැළකිය යුතු වැඩි වීමක් විය. 1986/87 මහ කන්නයේ වගා ණය ලත් ගොවීන් 41,390 න් ගොවීන් 1,920 ක් ස්වභාවික හේතූන් මත වගා හානි වීම නිසා න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය යටතේ දෙනු ලබන ණය ප්‍රතිලේඛනගත කිරීමේ පහසුකම සඳහා ඉදිරිපත් වූහ. ප්‍රතිලේඛනගත කරන ලද ණය ප්‍රමාණය ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 7 ක් විය. 1986 යල කන්නයේදී දෙන ලද ණය සඳහා 1987 දී ණය සහතික කිරීම ඇරඹිණ. බැංකුවල මුළු හිමිකම් පෑම් රුපියල් දශ ලක්ෂ 12.3 ක් වූ අතර ණය සහතික කිරීම පාලනය වන කොන්දේසි අනුව මහ බැංකුව විසින් හිමිකම් පෑමේ පළමු වාරිකය වශයෙන් රුපියල් දශ ලක්ෂ 6.1 ක් නැතහොත් සියයට 50 ක් ගෙවන ලදී. බැංකු විසින් කල් පසු වූ ණය අය කර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය කටයුතු ඉටු කළ විට ඉතිරි මුදල ගෙවනු ලැබේ.

යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී එකතු වූ අත්දැකීම් අනුව, වර්ෂය තුළදී න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමයෙහි යම් යම් සංශෝධන හා වෙනස්කම් ඇති කරන ලදී. න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය යටතේ ණය දීමෙහිදී සුරැකුම් ඉල්ලා සිටීම පිළිබඳ අවශ්‍යතාවය සිය කැමැත්ත අනුව අත්හැර දැමීමට ශාඛා කළමනාකරුවන්ට අවසර දෙන ලදී. කල් පසු වූ වගා ණය ප්‍රතිලේඛනගත කිරීම සම්බන්ධයෙන් වූ සමහර කොන්දේසි ලිහිල් කරන ලදී. සිය

කෘෂිකාර්මික කටයුතු අඛණ්ඩව කරගෙන යාම සහතික කරනු පිණිස තුන් වන ණයක් සඳහා සුදුසුකම් ලැබීමට ණය ගැනුම් කරුවනට හැකි වන පරිදි නිරන්තරව සිදු වන වගා හානි සම්බන්ධයෙන් පිළිවෙලින් දෙවරක ණය ප්‍රතිලේඛනගත කිරීම සඳහා අවසර දෙන ලදී. 1987 දී සීමාසහිත ලංකා වාණිජ බැංකුව ද මෙම යෝජනා ක්‍රමයට සහභාගි වන බැංකුවක් වශයෙන් ඇතුළත් කර ගැනුණි. න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමයෙහි සහභාගි වීම සඳහා ලියාපදිංචි කරන ලද සකසුරුවම් සහ ණය දෙන සමූපකාර සමිති සංඛ්‍යාව වර්ෂය තුළදී 20 සිට 29 දක්වා වැඩි විය.

ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලයේ (ලං. තෙ. මේ. සං. ම.) සත්වාහාර සහ එළවළු තෙල් නිපදවීම සඳහා අවශ්‍ය වන බඩ ඉරිඟු, සෝයා බෝංචි, ධාන්‍ය වර්ග සහ අනෙකුත් රළු ධාන්‍ය වර්ග මිළදී ගැනීමට මුදල් සැපයීම සඳහා වූ අලෙවි ණය යෝජනා ක්‍රමය 1987 දී ක්‍රියාත්මකව පැවති අතර වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 75 ක් ණය වශයෙන් දෙන ලදී. කෙසේවුවද, අපේක්ෂා කළ ආකාරයට ගොවීන්ට සහතික මිළක් ගෙවීමට හැකි වන ආකාරයෙන් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ලං. තෙ. මේ. සං. මණ්ඩලය අපොහොසත් වීම නිසා මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා අදළ නියෝජ්‍යායතන විසින් දිගුකාලීන පිළියමක් සලසනු ලබන තෙක් යෝජනා ක්‍රමය අත්හිටුවන ලදී.

සමාලෝචනයට භාජනව ඇති වර්ෂය තුළදී ග්‍රාමීය අංශයට මැදි හා දිගුකාලීන ණය සැපයීම සඳහා නව ණය යෝජනා ක්‍රම දෙකක් හඳුන්වා දුණි. කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (ඒ. ග්‍රා. සං. ව්‍යා.) යටතේ ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. වී, අතුරු ආහාර භෝග සහ කෙසෙල් වගාව, ගොවිපල ආයෝජනයන් (කිරිපට්ටි, සුළු අපනයන භෝග තවාන්, පොල් පොහොර, කෘෂි යන්ත්‍ර සහ උපකරණ) හා ගෘහ සහ කුඩා පරිමාණ කර්මාන්ත වැනි කටයුතු සඳහා බැංකු විසින් භාරගෙන ඇති ණය දීම්වලට ආධාරයක් වශයෙන් මෙම ණය මුදලින් රුපියල් දශ ලක්ෂ 50 ක් වෙන් කර ඇත. 1987 දී හඳුන්වා දෙන ලද අනෙක් නව යෝජනා ක්‍රමය වූයේ පැල්වත්ත සීනි නිෂ්පාදන ව්‍යාපෘතියෙහි පෞද්ගලික වගා කරුවන් සඳහා වූ ණය යෝජනා ක්‍රමයයි. මෙම යෝජනා ක්‍රමය යටතේ ලංකා බැංකුව විසින් පෞද්ගලික උක් වගා කාරුවනට දෙනු ලබන ණය මුදල් සඳහා මහ බැංකුව විසින් සියයට සියයක්ම ප්‍රතිමූල්‍ය පහසුකම් සලසනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය සඳහා මහ බැංකුව රුපියල් දශ ලක්ෂ 39.3 ක් වෙන් කර ඇත.

1987 දී, පවත්නා ණය යෝජනා ක්‍රමයන්හි සංශෝධන හා පුළුල් කිරීම් කිහිපයක් ඇති කරන ලදී. යෝජනා ක්‍රමයන්හි ප්‍රයෝජනයට නොගෙන ඇති සම්පත් උපයෝගී කර ගැනීම සඳහා 1987 දී අවසන් වීමට නියමිතව තිබූ බදුල්ල දිස්ත්‍රික්කයේ ඒ. ග්‍රා. සං. යෝ. ක්‍රමය සහ මාතලේ-පුත්තලම දිස්ත්‍රික්කයන්හි ඒ. ග්‍රා. සං. යෝ. ක්‍රමය අවුරුද්දකින් දීර්ඝ කර ඇත. ආදායම් උපදවන කටයුතුවල නියුතු වතු අංශයේ කාන්තාවන්ට ආධාර දීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය අවසන් කිරීමේ දිනයද 1987 සිට 1988 දක්වා දීර්ඝ කරන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගම් නහා සිටුවීම හා ස්වයං රැකියා වැඩ පිළිවෙල යටතේ තෝරා ගන්නා ලද ව්‍යාපෘතීන්වලට මුදල් සැපයීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණය සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීම පිණිස 1987 දී මහ බැංකුව විසින් වෙන් කරන ලද මුදල් සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගෙන ඇති හෙයින් ඒ සඳහා මහ බැංකුව තවත් රුපියල් දශ ලක්ෂ 6 ක අතිරේක මුදලක් වෙන්කර ඇත.

සෑම පුද්ගලයකුටම අයිති කොටසෙහි උපරිම ප්‍රමාණය අක්කර 50 ට වැඩි නොවන්නේ නම්, හවුල්ව හෝ පෞද්ගලික සමාගම් මගින් පාලනය වන අක්කර 50 ට වැඩි ඉඩම්ද ඇතුළත් වන පරිදි පොල් පොහොර ණය යෝජනා ක්‍රමයට සුදුසුකම් ලැබීම සඳහා වූ කොන්දේසි මහ බැංකුව විසින් වෙනස් කරන ලදී. ශ්‍රී ලංකා/ආසියානු සංවර්ධන බැංකු පශු සංවර්ධන ව්‍යාපෘතියෙහි පශු නිෂ්පාදකයින්ගේ සමිතිවලට දෙන ණය හා සම්බන්ධ අංශය 1987 දී ක්‍රියාත්මක විණි.

නිම කරන ලද හෝ සහභාගී වන බැංකුවලින් ඉල්ලීමක් නැති ණය යෝජනා ක්‍රම කිහිපයක් නතර කර දමනු ලැබිණි. මේ අතරම, උඩවැඩියා මල් වගා කිරීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (ලංකා බැංකුව/සීමාසහිත ලංකා දුම්කොළ සමාගම), වැව් වාරිමාර්ග නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වූ කෘෂි උපකරණ ණය යෝජනා ක්‍රමය, අබුඩාබියෙන් අරමුදල් ලද නිරිතදිග වෙරළ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය, උඩවැඩියා මල් වගා කිරීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (ලංකා බැංකුව/සර්වෝදය/ලක්මල්සැල) සහ හුලං මෝල් තැනීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය අයත් වේ. සමන්තුරේ ඡන්ද කොට්ඨාශයෙහි වූ කිරි පට්ටි සංවර්ධන (නියාමක) ව්‍යාපෘතිය සඳහා වූ ණය යෝජනා ක්‍රමය සහ ජීව වායු ඒකක පිහිටුවීම පිණිස මිනිපේ යෝජනා ක්‍රමයෙහි පදිංචිකරුවනට ආධාර කිරීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය ද, දීප ව්‍යාප්ත කිරි පට්ටි සංවර්ධන ණය යෝජනා ක්‍රමයට ඒකාබද්ධ කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදි හා දිගු කාලීන ණය අරමුදලේ පළමුවන කාණ්ඩයේ ප්‍රතිමූල්‍ය පහසුකම් මගින් ආධාර ලබන මැදි හා දිගු කාලීන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙහි ලා ලබා ඇති ප්‍රගතිය 2.7 වැනි සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

1987 වර්ෂයේදී මැදි හා දිගු කාලීන ණය යෝජනා ක්‍රම 29 ක් ක්‍රියාත්මක වූ අතර, මෙම යෝජනා ක්‍රම යටතේ දෙන ලද ණය සම්බන්ධයෙන් ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීම සඳහා රුපියල් දශ ලක්ෂ 1,115 ක මුළු මුදලක් වෙන්කර ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ සහභාගී වන බැංකු විසින් ප්‍රයෝජනයට ගන්නා ලද මුළු ප්‍රතිමූල්‍ය පහසුකම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 434 ක් නැතහොත් මුළු වෙන් කිරීමෙන් සියයට 39 ක් විය. ප්‍රතිමූල්‍ය පහසුකම් උපයෝගී කර ගැනීමෙහි ලා සතුටුදායක ප්‍රගතියක් දැක්වූ යෝජනා ක්‍රම අතර පොල් පොහොර ණය යෝජනා ක්‍රමය (සියයට 62), මාතලේ–පුත්තලම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය (සියයට 75), දීප ව්‍යාප්ත කෘෂි යන්ත්‍ර ණය යෝජනා ක්‍රමය (සියයට 59) සහ අනුරාධපුර (1987 නොවැම්බර් වනවිට සියයට 100), මාතර (සියයට 100), කළුතර හා කුරුණෑගල (සියයට 73) යන දිස්ත්‍රික්කයන්හි ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ද වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය සඳහා වෙන් කරන ලද මුදල 1987 දී අවසන් වීම නිසා වර්ෂය අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 6 ක මුදලක් අළුතින් වෙන් කරන ලදී. එසේම, මාතර දිස්ත්‍රික්කයේ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය සඳහාද 1987 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 10 ක මුදලක් අළුතින් වෙන් කරන ලදී. දීප ව්‍යාප්ත කෘෂි යන්ත්‍ර මිළදී ගැනීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය සඳහා වෙන් කරන ලද ප්‍රතිමූල්‍ය පහසුකමද වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 20 කින් වැඩිකර ඇත.

පසුගිය කාලවල ණය අයකර ගැනීමේ අනුපාතිකයන් බෙහෙවින් පහත්ව පැවතීම නිසා ඉකුත් වර්ෂයේ මෙන් ධීවර අංශයට ණය දීම සඳහා බැංකු අකමැති විය. එබඳු ණය පැහැර හැරීම් අධික වීම නිසා බැංකුවලට මුහුණපෑමට සිදුවූ ගැටළුවලින් මිදීමට ආධාරවීමේ අරමුණින් යුතුව මහ බැංකුව විසින් ධීවර අංශ බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණය ප්‍රති-ලේඛනගත කිරීම සඳහා වැඩ පිළිවෙලක් හඳුන්වා දෙන ලදී.

ග්‍රාමීය අංශයට දෙනු ලබන සිය ආයෝජන ණයවලින් විය හැකි අලාභවලට එරෙහිව කිසියම් ප්‍රමාණයකට ආරක්ෂාව සැලසීමෙන් ණය දෙන බැංකුවලට පිහිටවීමේ අරමුණින් යුතුව, මහ බැංකුව 1987 දී නම් කරන ලද මැදි හා දිගු කාලීන ණය යෝජනා ක්‍රම කිහිපයක්ද ණය සහතික ක්‍රමය යටතට ගෙන ඒමට තීරණය කළේය. මූලික වශයෙන් දීප ව්‍යාප්ත කිරිපට්ටි සංවර්ධන ණය යෝජනා ක්‍රමය සහ ශ්‍රී ලංකා ආසියානු සංවර්ධන බැංකු පශු සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය, ණය සහතික ක්‍රමය යටතට ගෙන එන ලදී. කෙටි කාලීන වගා කටයුතු සඳහා දෙන ලද ණය සහතික කිරීම පිණිස මහ බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 300 ක මූලික දායක මුදලක් සහිතව 1985 දී පිහිටුවන ලද ණය සහතික අරමුදල, මැදි හා දිගු කාලීන ණය අරමුදල යටතේ නම් කරන ලද ණය යෝජනා ක්‍රමවලට දෙන ලද ණය සහතික කිරීම සඳහාද පොදු අරමුදලක් වශයෙන් ක්‍රියා කරනු ඇත.

## මැදි හා දිගු කාලීන ණය අරමුදලේ සඳහා අනුමත කරන

| ණය යෝජනා ක්‍රමයේ නම | වෙන් කරන ලද ප්‍රතිමූල්‍ය (රුපියල් දශ ලක්ෂ) |
|---|---|
| **(අ) 1987 වර්ෂය ආරම්භයේදී තිබූ ණය යෝජනා ක්‍රම** | |
| 1. පොල් පොහොර ණය යෝජනා ක්‍රමය .. | 55·00 |
| 2. ධීවර අංශය සඳහා බැංකු ණය යෝජනා ක්‍රමය .. | 140·00 |
| 3. විවිධ සේවා සමුපකාර සමිති විසින් ඉදි කරන පොහොර ගබඩා සඳහා ණය යෝජනා ක්‍රමය .. | 14·00 |
| 4. ධීවර සමුපකාර සඳහා ණය යෝජනා ක්‍රමය .. | 42·00 |
| 5. මාතලේ – පුත්තලම දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල .. | 54·79 |
| 6. මාතර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා යෝජනා ක්‍රමය .. | 18·20 |
| 7. ආසියානු සංවර්ධන බැංකු/ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය .. | 137·00 |
| 8. කුඩා තේ ඉඩම් හිමියන් සඳහා වන පොහොර ණය යෝජනා ක්‍රමය .. | 7·50 |
| 9. ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන දිස්ත්‍රික්කවල බර අදින සතුන් මිළට ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය .. | 5·60 |
| 10. ගම් නගා සිටුවීම සහ ස්වයං රැකියා වැඩ පිළිවෙල යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හඳුනා ගන්නා ලද ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය .. | 12·00 |
| 11. ගොවිපලවල කුඩා පරිමාණයේ බීජ අර්තාපල් ගබඩා ඉදි කිරීම් සඳහා ණය යෝජනා ක්‍රමය .. | 1·00 |
| 12. බදුලු දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල .. | 7·00 |
| 13. මාදැල් මගින් මසුන් ඇල්ලීමේ ණය යෝජනා ක්‍රමය (වෙරලේ සිට දැල් ඇදීම) .. | 5·00 |
| 14. පැල්වත්ත සීනි ව්‍යාපෘතිය යටතේ උක් වවන්නන් සඳහා ණය යෝජනා ක්‍රමය | 66·00 |
| 15. වවුනියා – මන්නාරම දිස්ත්‍රික්ක ඒකාබද්ධ සංවර්ධන වැඩ පිළිවෙල .. | 32·00 |
| 16. සෙවනගල, හිඟුරාන සහ කන්තලේ සීනි ව්‍යාපෘති යටතේ උක් වවන සුළු ගොවීන් සඳහා ඇති ණය යෝජනා ක්‍රමය .. | 120·60 |
| 17. රඹුක්කන ප්‍රදේශයේ පොල් වවන්නන්ට අතුරු වගාව සහ නැවත වගාව සඳහා දෙනු ලබන ශ්‍රී ලංකා/ආසියානු සංවර්ධන බැංකු පොල් සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය .. | 8·00 |
| 18. වික්ටෝරියා ව්‍යාපෘතිය යටතේ තැන් අහිමිවූ වෙළෙඳුන්ට වාණිජ ගොඩනැගිලි මිළදී ගැනීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය .. | 22·00 |
| 19. කෘෂි උපකරණ මිළදී ගැනීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමය .. | 106·99 |
| 20. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ කාන්තා කාර්යාංශ ව්‍යාපෘතිය යටතේ ආදයම් ඉපයීමේ කටයුතුවල නියැලීම සඳහා වතු අංශයේ කාන්තාවනට සහාය වීමේ විශේෂ ණය යෝජනා ක්‍රමය .. | 1·00 |
| 21. කුරුණෑගල, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල චීන ඉඟුරු, අන්නාසි සහ වැල් දෙඩම් වගාව සඳහා ණය යෝජනා ක්‍රමය .. | 32·00 |
| 22. අනුරාධපුර වියළි කලාපීය කෘෂි ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය .. | 22·30 |
| 23. ශ්‍රී ලංකා/ආසියානු සංවර්ධන බැංකු පශු සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමය .. | 63·20 |
| 24. මහනුවර, කෑගල්ල සහ මාතලේ දිස්ත්‍රික්කවල ස්වයං රැකියා සහ වෙනත් මධ්‍යම ප්‍රමාණයේ ගොවිපල ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීම සඳහා වූ ණය ක්‍රමය .. | 6·00 |
| 25. කිරි පට්ටි සංවර්ධනය සඳහා ණය යෝජනා ක්‍රමය .. | 20·60 |
| 26. කළුතර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ස්වයං රැකියා දියුණු කිරීමේ ණය යෝජනා ක්‍රමය .. | 20·00 |
| 27. උස්සාන වාරිමාර්ග සඳහා අවශ්‍ය නළ ළිං තැනීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය .. | 1·10 |
| **(ආ) 1987 වර්ෂය තුළදී අනුමත කරන ලද ණය යෝජනා ක්‍රම** | |
| 1. කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල .. | 50·00 |
| 2. පැල්වත්ත සීනි ව්‍යාපෘතිය යටතේ පෞද්ගලික උක් වවන්නන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය .. | 39·30 |
| එකතුව .. | 1,115·18 |

2 . 7 සංඛ්‍යා සටහන

## 1 වැනි කාණ්ඩය යටතේ ප්‍රතිමූල්‍යනය

### ලද ණය ක්‍රම

| 1987.12.31 වැනි දිනට එයින් ප්‍රයෝජනයට ගෙන ඇති ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ) | 1987.12.31 වැනි දිනට එයින් ප්‍රයෝජනයට නොගෙන තිබූ ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ) | ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය | වෙන් කරන ලද ප්‍රතිමූල්‍ය ප්‍රයෝජනයට ගත හැකි කාලය (අවුරුදු) |
|---|---|---|---|
| 49·96 | 5·04 | 26·03·79 | 3 |
| 114·98 | 25·02 | 02·07·79 | 3 |
| 9·14 | 4·86 | 13·10·80 | 1 |
| 1·28 | 40·72 | 28·04·81 | 2 |
| 53·84 | 0·95 | 08·05·81 | 6 |
| 8·94 | 9·26 | 10·04·81 | — |
| 82·31 | 54·69 | 01·07·82 | 5 |
| 1·36 | 6·14 | 11·08·82 | 1 |
| 0·01 | 5·59 | 10·09·82 | 2 |
| 6·27 | 5·73 | 14·10·82 | — |
| ... | 1·00 | 01·03·83 | 1 |
| 3·83 | 3·17 | 27·09·83 | 5 |
| 0·89 | 4·11 | 26·04·84 | 1 |
| 9·88 | 56·12 | 10·05·84 | 6 |
| 0·70 | 31·30 | 14·06·84 | 4 |
| 15·51 | 105·09 | 20·09·84 | 5 |
| 0·10 | 7·90 | 26·12·84 | 3 |
| — | 22·00 | 11·03·85 | 2 |
| 48·25 | 58·74 | 26·03·85 | 2 |
| 0·31 | 0·69 | 31·12·85 | 1 |
| 3·95 | 28·05 | 27·06·85 | 3 |
| 2·47 | 19·83 | 02·07·85 | 3 |
| 1·14 | 67·06 | 01·03·86 | 3 |
| 1·75 | 4·25 | 01·03·86 | — |
| 2·51 | 18·09 | 16·04·86 | 3 |
| 14·66 | 5·34 | 15·05·86 | — |
| 0·11 | 0·99 | 08·09·86 | 2 |
| | 50·00 | 15·01·87 | 5 |
| | 39·30 | 07·08·87 | 7 |
| 434·15 | 681·03 | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

දිස්ත්‍රික්ක කිහිපයක ඉඩම් අහිමි සහ සුළු ගොවීන් වෙනුවෙන් ග්‍රාමීය ණය ව්‍යාපෘතියක් හඳුනා ගැනීම, ඇගැයීම සහ සකස් කිරීම සඳහා 1987 දී කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලින් දූත පිරිස් කිහිපයක් මෙහි පැමිණියහ. ශ්‍රී ලංකා රජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල අතර ණයදීම ඇගැයීමෙහිදී පදනමක් වශයෙන් සැළකෙන එකගතා ප්‍රකාශනයක් පිළියෙල කරන ලදී. ව්‍යාපෘතිය සඳහා ණය ලබා ගැනීම පිළිබඳ සාකච්ඡා 1988 දී ආරම්භ වීමට නියමිතය. ග්‍රාමීය ණය තත්ත්වය විග්‍රහකර බැලීම සහ එය වැඩි දියුණු කිරීම පිළිබඳ නිර්දේශ යෝජනා කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ හා ආසියානු සංවර්ධන බැංකුවේ ආරාධනය පරිදි ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආයෝජන මධ්‍යස්ථානයේ දූත පිරිසක් ද 1987 දී ශ්‍රී ලංකාවට පැමිණියහ.

වර්ෂය තුළදී මහ බැංකුව විසින් ලංකා බැංකුවේ ශාඛා 4 කද, මහජන බැංකුවේ ශාඛා 4 කද, සමුපකාර ග්‍රාමීය බැංකු 3 ක සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රා. ග්‍රා. සං. බැංකුවේද කෘෂිකාර්මික ණයදීම් පිළිබඳ කටයුතු පරීක්ෂාකර අවසන් කරන ලදී. මෙම බැංකු ශාඛාවන් වූයේ මාතලේ, බදුල්ල, ගම්පහ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හිය. ග්‍රාමීය අංශයට ණයදීම වැඩි දියුණු කිරීම සහ නිරීක්ෂණය කරන ලද අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගයන් නිර්දේශ කරමින් ඒ ඒ බැංකුවල ප්‍රධාන කාර්යාල වෙතද, දිස්ත්‍රික්/ප්‍රාදේශීය කාර්යාල සහ පරීක්ෂා කරන ලද ශාඛා වෙතද පරීක්ෂණ වාර්තා යවන ලදී. පරීක්ෂා කරන ලද බැංකු ශාඛාවන්ගේ පිළිතුරු වාර්තා අනුව මහ බැංකුව මෙම පරීක්ෂණවල තවදුරටත් නිරත විය.

## ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා. ග්‍රා. සං. බැ.)

1987 වර්ෂය අවසානයට ක්‍රියාත්මකව පැවති මුළු ප්‍රා. ග්‍රා. සං. බැංකු සංඛ්‍යාව 9 ක් කෙරෙමින් 1987 දී කෑගල්ල, පුත්තලම, ගාල්ල සහ මහනුවර යන දිස්ත්‍රික්කයන්හි ප්‍රා. ග්‍රා. සං. බැංකු 4 ක් පිහිටුවන ලදී. 2.8 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි මෙම ප්‍රා. ග්‍රා. සං. බැංකු නවය විසින් සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී අළුතින් ආරම්භ කරන ලද ශාඛා 29 ද සමග සිය ශාඛා පද්ධතිය 61 දක්වා පුළුල් කර ඇත.

### 2.8 සංඛ්‍යා සටහන

### ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා පද්ධතිය

| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ නම | ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව ආරම්භ කළ දිනය | ප්‍රධාන කාර්යාලය | විවෘත කරන ලද ශාඛා සංඛ්‍යාව 1985 | 1986 | 1987 | 1987 වර්ෂය අවසානයට එකතුව |
|---|---|---|---|---|---|---|
| කළුතර .. | 13·07·85 | බුලත්සිංහල | 4 | 3 | 4 | 11 |
| මාතර .. | 28·07·85 | යටියන | 5 | 2 | — | 7 |
| කුරුණෑගල .. | 10·08·85 | කුලියාපිටිය | 6 | 4 | 2 | 12 |
| අනුරාධපුරය .. | 12·08·85 | මිහින්තලේ | 2 | 4 | 1 | 7 |
| හම්බන්තොට .. | 13·12·86 | අම්බලන්තොට | — | 2 | 2 | 4 |
| කෑගල්ල .. | 08·02·87 | හෙට්ටිමුල්ල | — | — | 8 | 8 |
| පුත්තලම .. | 11·07·87 | හලාවත | — | — | 5 | 5 |
| ගාල්ල .. | 17·08·87 | ඇල්පිටිය | — | — | 1 | 1 |
| මහනුවර .. | 03·10·87 | ගම්පොල | — | — | 6 | 6 |
| එකතුව .. | | | 17 | 15 | 29 | 61 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1987 වර්ෂයේදී ප්‍රා. ග්‍රා. සං. බැංකු කටයුතුවල සැළකිය යුතු පුළුල් වීමක් දක්නට ලැබුණි. 1986 වර්ෂය අග පැවති තත්ත්වය හා සසඳා බලන කල තැන්පතු රැස් කිරීමෙහිලා දෙගුණයකටත් වඩා වැඩි වීමක් දක්නට ලැබෙන අතර, ණය දීම් එකහමාරක ප්‍රමාණයකින් වැඩිවී ඇත. ජංගම ගිණුම් කටයුතු සහ උකස් බඩු ගැනීම ආරම්භ කිරීමෙන් පසු ප්‍රා. ග්‍රා. සං. බැංකු කිහිපයක කටයුතු විවිධාංගීකරණය වී ඇත.

## 2 . 9 සංඛ්‍යා සටහන

### දිස්ත්‍රික්ක අනුව එක්රැස් කරන ලද තැන්පතු
### 1986 සහ 1987 අවසානයට

(මුදල රුපියල් දහස් වලින්)

| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ නම | ඉතිරි කිරීමේ තැන්පතු | | | | ස්ථිර තැන්පතු | | | | එකතුව | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1986 | | 1987 | | 1986 | | 1987 | | 1986 | | 1987 | |
| | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල |
| කළුතර .. | 10,295 | 3,389 | 20,563 | 8,496 | 94 | 3,446 | 133 | 3,532 | 10,389 | 6,835 | 20,696 | 12,028 |
| මාතර .. | 10,503 | 5,350 | 16,657 | 12,174 | 105 | 672 | 203 | 1,898 | 10,608 | 6,022 | 16,860 | 14,072 |
| කුරුණෑගල .. | 13,958 | 4,221 | 20,042 | 9,399 | 49 | 466 | 150 | 2,000 | 14,007 | 4,687 | 20,192 | 11,399 |
| අනුරාධපුර .. | 5,653 | 2,749 | 8,483 | 3,802 | 2 | 42 | 11 | 611 | 5,655 | 2,790 | 8,494 | 4,413 |
| හම්බන්තොට .. | 509 | 259 | 5,839 | 3,239 | 6 | 48 | 75 | 462 | 515 | 307 | 5,914 | 3,701 |
| කෑගල්ල .. | — | — | 8,888 | 3,113 | — | — | 47 | 421 | — | — | 8,935 | 3,534 |
| පුත්තලම .. | — | — | 3,091 | 1,706 | — | — | 15 | 71 | — | — | 3,106 | 1,777 |
| ගාල්ල .. | — | — | 1,230 | 941 | — | — | 19 | 136 | — | — | 1,249 | 1,077 |
| මහනුවර .. | — | — | 2,519 | 886 | — | — | 13 | 88 | — | — | 2,532 | 974 |
| එකතුව .. | 40,918 | 15,968 | 87,312 | 43,756 | 256 | 4,674 | 666 | 9,219 | 41,174 | 20,641 | 87,978 | 52,975 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1986 අවසාන වනවිට තැන්පතු ගිණුම් 41,174 ක පැවති රුපියල් දශ ලක්ෂ 21 හා සසඳා බලන කල, 1987 දෙසැම්බර් මස 31 වැනි දින වන විට ප්‍රා. ග්‍රා. සං. බැංකු 9 විසින් තැන්පතු ගිණුම් 87,978 ක් මගින් රැස්කරන ලද මුළු තැන්පතුවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 53 ක් විය. ඉතිරි කිරීම් සහ ස්ථිර තැන්පතු යන දෙකම එක්ව ගෙන සළකා බලන කල තැන්පතුවල සාමාන්‍ය වටිනාකම 1986 දී රුපියල් 501 සිට 1987 දී රුපියල් 602 දක්වා වැඩි විය. වටිනාකම අනුව මුළු තැන්පතුවල සංයුතිය දැක්වූයේ සියයට 83 ක් පමණ ඉතිරි කිරීමේ ගිණුම්වලත් සියයට 17 ක් පමණ ස්ථිර තැන්පතුවලත් වූ බවය. 1987 දී ප්‍රා. ග්‍රා. සං. බැංකු මගින් සේවය කරන ලද මුළු ගණුදෙනුකරුවන් සංඛ්‍යාවට ආසන්න මිනුමක් වශයෙන් සැළකිය හැකි මුළු තැන්පතු සංඛ්‍යාවෙන්, තැන්පතු 87,312 ක් නැතහොත් සියයට 99 ක් ඉතිරි කිරීමේ ගිණුම් නියෝජනය කළේය. ඒ ඒ ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් රැස් කරන ලද ඉතිරි කිරීමේ හා ස්ථිර තැන්පතු සම්බන්ධයෙන් වූ සවිස්තරාත්මක තොරතුරු 2.9 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

ප්‍රා. ග්‍රා. සං. බැංකුවල ණය දීමේ කටයුතු 1986 අගදී 8,243 ක ණය සංඛ්‍යාවක සිට 1987 දී 13,801 ක ණය සංඛ්‍යාවක් දක්වා සීඝ්‍රයෙන් පුළුල් විය. පසුගිය වර්ෂය අවසානයේ පැවති තත්ත්වය හා සසඳා බලන විට, 1987 අවසානයට දෙන ලද ණයවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 96.1 ක් වූ අතර, එය සියයට 47 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. දෙන ලද මුළු ණය සංඛ්‍යාව සියයට 67 ක වැඩි වීමක් දැක්වීය. ඒ ඒ ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් දෙන ලද ණය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු 2.10 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ. කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා ණය දීම කෙරෙහි සැළකිය යුතු නැඹුරු වීමක් සිදුව ඇති බැව් ණය ලබාගත් අරමුණු පැතිර ඇති ආකාරයෙන් පෙනී ගිය අතර, කුඩා ණය ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් ගනු ලැබූ ඉමහත් උත්සාහය එක් පුද්ගලයෙක් සඳහා වූ ණයවල සාමාන්‍ය ප්‍රමාණය අඩු වීමෙන් පිළිබිඹු වේ. එක් ප්‍රා. ග්‍රා. සං. බැංකුවක සිට අනෙක දක්වා අරමුණු අනුව ණය දීමේ කටයුතුවල පැහැදිලි වෙනස්කම් දක්නට ලැබුනද සමස්තයක් වශයෙන් ගත් කල වගා කටයුතු, කෘෂි උපකරණ සහ වෙනත් වර්ගයන් ඇතුලත් වූ කෘෂිකාර්මික ණය, 1987 දී මුළු ණයවලින් සියයට 36 ක් පමණ විය. තවත් සියයට 7 ක් පමණ සත්ව නිෂ්පාදන කටයුතු සඳහා වූ අතර ණය මාලාවෙන් සියයට 16 ක් පමණ කුඩා කර්මාන්ත සඳහා දෙනු ලැබූ ණයවලින් සංයුක්ත විය. වෙළෙඳ සහ ව්‍යාපාරික කටයුතු සඳහා දෙන ලද ණයවල කොටස සියයට 35 ක් පමණ විය. 2.11 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇති පරිදි 1986 හා සසඳා බලන කල, අරමුණු අනුව ණය පැතිර ඇති ආකාරයෙහි සැළකිය යුතු වෙනසක් 1987 වසරේදී සිදුවී නොමැත.

## 2 . 10 සංඛ්‍යා සටහන

### 1985, 1986 සහ 1987 වර්ෂවල දිස්ත්‍රික්ක අනුව දෙන ලද ණය

(මුදල රුපියල් දහස්)

| දිස්ත්‍රික්කය | 1985 | | 1986 | | 1987 | | එකතුව (1985–1987) | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල |
| කළුතර .. | 335 | 1,154 | 1,799 | 5,740 | 2,700 | 12,787 | 4,834 | 19,681 |
| මාතර .. | 482 | 787 | 3,424 | 12,602 | 4,977 | 20,166 | 8,883 | 33,555 |
| කුරුණෑගල .. | 123 | 1,226 | 1,771 | 14,553 | 1,347 | 11,551 | 3,241 | 27,330 |
| අනුරාධපුරය .. | 164 | 1,681 | 1,249 | 32,320 | 1,965 | 38,334 | 3,378 | 72,335 |
| හම්බන්තොට .. | — | — | — | — | 1,609 | 5,752 | 1,609 | 5,752 |
| කෑගල්ල .. | — | — | — | — | 900 | 5,929 | 900 | 5,929 |
| පුත්තලම .. | — | — | — | — | 109 | 828 | 109 | 828 |
| ගාල්ල .. | — | — | — | — | 80 | 509 | 80 | 509 |
| මහනුවර .. | — | — | — | — | 114 | 280 | 114 | 280 |
| එකතුව .. | 1,104 | 4,848 | 8,243 | 65,215 | 13,801 | 96,136 | 23,148 | 166,199 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## 2 . 11 සංඛ්‍යා සටහන

### 1985, 1986 සහ 1987 වර්ෂවල දෙනලද ණය මුදල් කාර්යයන් අනුව සංසන්දනය

| කාර්යය | 1985 | | | 1986 | | | 1987 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | මුදල රු. දහස් | සියයට ගණන | සංඛ්‍යාව | මුදල රු. දහස් | සියයට ගණන | සංඛ්‍යාව | මුදල රු. දහස් | සියයට ගණන |
| කෘෂිකර්මය ... .. | 395 | 2,027 | 42 | 4,234 | 23,388 | 36 | 6,816 | 34,950 | 36 |
| පශු සම්පත් .. .. | 77 | 554 | 11 | 585 | 4,905 | 07 | 1,000 | 6,353 | 07 |
| කුඩා කර්මාන්ත .. .. | 257 | 999 | 21 | 1,375 | 8,304 | 13 | 2,429 | 15,229 | 16 |
| වෙළෙඳ හා ව්‍යාපාරික කටයුතු .. .. | 287 | 790 | 16 | 1,394 | 25,161 | 39 | 2,228 | 33,454 | 35 |
| වෙනත් .. .. | 88 | 478 | 10 | 655 | 3,457 | 05 | 1,328 | 6,150 | 06 |
| එකතුව .. .. | 1,104 | 4,848 | 100 | 8,243 | 65,215 | 100 | 13,801 | 96,136 | 100 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සාපේක්ෂ වශයෙන් සළකා බලන කල ප්‍රා. ග්‍රා. සං. බැංකුවලට ලබාගත හැකි අඩු සම්පත් මට්ටම සහ සාමාන්‍යයෙන් අනෙකුත් වාණිජ බැංකු ඉලක්ක කරගත් කණ්ඩායමට ඇතුලත් නොවන කුඩා ණය ගැනුම්කරුවන්ට ආධාර වීම සඳහා ඒවායේ කැපවීම සැළකිල්ලට ගනිමින් ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් කුඩා ගොවීන්ට, කුඩා ව්‍යවසායකයින්ට සහ අනෙකුත් කුඩා ණය ගැනුම්කරුවනට සහාය වීම පිණිස සුළු ප්‍රමාණයන්ගෙන් ණය දීම කෙරෙහි වැඩි අවධානයක් දක්වනු ලැබීය. "ජනහමුව" නැතහොත් ප්‍රාදේශීය මට්ටමින් රැස්වීම් පැවැත්වීම සහ තොරතුරු සැපයීම, ණය ගැනුම්කරුවන් දැනුවත් කිරීම හා ඔවුන්ගේ ණය ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා වූ ක්ෂේත්‍රීය සංචාරයන් වැනි ක්‍රම ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් ප්‍රයෝජනයට ගන්නා ලදී. ආදයම් උපදවීම සහ ස්වයං රැකියා අවස්ථාවන් වැඩි කිරීම මගින් ග්‍රාමීය සංවර්ධනය නංවාලීම සඳහා දයකව ඇති හෙයින් ප්‍රා. ග්‍රා. සං. බැංකුවල අත්දැකීම් මේතාක් දිරි ගන්වන සුළු ය. ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍රීය නිලධාරීන් මාර්ගයෙන් ණය කටයුතු සාර්ථකව පරීක්ෂා කළ හැකි වීම නිසා මෙම බැංකුවලට ඉහළ ණය ආපසු අය කර ගැනීමේ අනුපාතිකයක් පවත්වා ගත යාමට හැකිවී ඇත.

## ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

1987 වර්ෂයේදී සහභාගිවන්නන් 928 දෙනෙකු සඳහා පාඨමාලා සහ සම්මන්ත්‍රණ 42 ක් ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වනු ලැබීය. සහභාගි වූ සියලුම දෙනා අතර වාණිජ බැංකුවලින් 273 ක්ද, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලින් 225 ක් සහ මහ බැංකුවෙන් 146 දෙනෙක්ද වූහ. ඔවුහු සියළු දෙනාම පාගේ බැංකු අංශයෙහි මධ්‍යම හා පහළ මට්ටමේ කළමනාකරණ නිලධාරීන් වූහ.

කෘෂිකාර්මික හා සුළු පරිමාණ කාර්මික ව්‍යාපෘති මූල්‍යකරණය, වාණිජ ණය හා මූල්‍ය විශ්ලේෂණය, අලෙවිකරණය, විදේශ විනිමය කටයුතු, එතෙර බැංකු කටයුතු, විදේශ වෙළඳාම මූල්‍යකරණය යන ක්ෂේත්‍රයන්හි සහ මානව සම්පත් කළමනාකරණයට සහ කළමනාකාරිත්ව සංවර්ධනයට අදල විශේෂ කළමනාකරණ වැඩ සටහන්ද විද්‍යාලය විසින් පවත්වා ඇත. 1987 වර්ෂය තුළදී මානව සම්පත් කළමනාකරණය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය යන විෂයන්ද ඇතුළත් කරමින් විෂය මාලාවෙහි වෙනස්කම් සමහරක් සිදු කර ඇත.

1987 දී අභ්‍යාස විද්‍යාලය විසින් කොළඹින් පිටත පුහුණු පාඨමාලා 17 ක් සංවිධානය කර පවත්වන ලදී. මෙම පාඨමාලාවලින් 4 ක් සංවිධානය කරන ලද්දේ පෞද්ගලික අංශයේ කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ යහපත සඳහා ඔවුන්ගේ කළමනාකරණ අවශ්‍යතා නංවාලීමේ අරමුණින් යුතුවය. විද්‍යාලයෙන් බැහැරව පැවැත්වූ පාඨමාලාවලින් 6 ක් ප්‍රා. ග්‍රා. සං. බැංකු වලට අළුතින් බඳවාගත් නිලධාරීන් සඳහා විය.

කොළඹින් බැහැරව පැවැත්වුණු පාඨමාලාවලින් 2 ක් කිරිඳිඔය වාරිමාර්ග සහ ගොවි ජනපද ව්‍යාපෘතියේ II වන අදියර සඳහා සහභාගිවන බැංකුවල කාර්ය මණ්ඩලය සඳහා විය. තවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉල්ලීමක් පරිදි වාණිජ විද්‍යා ගුරු උපදේශකවරුන් සඳහා සිව් දින සම්මන්ත්‍රණයක් පවත්වනු ලැබීය.

ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය සිය කටයුතු අරඹා, 1987 සැප්තැම්බර් මාසයට වසර හයක් සම්පූර්ණ විය. ඒ නිමිත්තෙන් පැවැත්වුණු හයවැනි සංවත්සර උළෙලට විශේෂ අමුත්තා වශයෙන් සහභාගි වූ තායිලන්ත මහ බැංකුවේ අධිපති කම්චෝර්න් සතිරාකුල් මහතා, උළෙලට ආරාධනා ලැබ රැස්ව සිටි මහ බැංකු, වාණිජ බැංකු, සංවර්ධන බැංකු, මූල්‍ය ආයතන, අදල අමාත්‍යාංශ සහ රජයේ දෙපාර්තමේන්තුවල විධායක නිලධාරීන් අමතා "ග්‍රාමීය සංවර්ධනයේදී මූල්‍ය ආයතනවල කාර්යභාරය—තායිලන්ත අත්දැකීම්" යන මැයෙන් දේශනයක් පැවැත්වීය.

## සේවක අර්ථ සාධක අරමුදල (සේ. අ. අ.)

සේ. අ. අ. පනතේ විධිවිධානයන් ප්‍රකාර සේවක අර්ථ සාධක අරමුදලට කෙරෙන දායක දීමනා සහ අයිභාර මුදල් ලබා ගැනීම, අරමුදල සතු මුදල් ආයෝජනය කිරීමෙන් ආදායම් ලබා ගැනීම, අරමුදලේ ලියාපදිංචි සේවායන්ගේ හා ඒ ඒ සාමාජිකයින්ගේ ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වාගෙන යාම සහ ප්‍රතිලාභ මුදල් සාමාජිකයින් වෙත ආපසු ගෙවීමේ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. මෙම කටයුතු මහ බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදල් දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර, පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනමය කටයුතු භාරව කටයුතු කරන කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථ සාධක අරමුදල් අංශය සමඟ කිට්ටු සහයෝගිතාවයකින් ක්‍රියා කරනු ලැබේ.

### දායක මුදල්

1986 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 2,047.9 හා සසඳා බලන කල 1987 වර්ෂය තුළදී අරමුදලට ලැබුණු දායක මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,194.3 ක් විය. මෙය කලින් වර්ෂය තුළ ලැබුණු දායක මුදලට වඩා රුපියල් දශ ලක්ෂ 146.4 කින් හෙවත් සියයට 7.1 කින් වැඩි වීමකි.

### සාමාජිකයින්ගේ ශේෂ

සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය සඳහා පොළී එකතු කිරීමට පෙර, 1987 දෙසැම්බර් 31 දිනට සාමාජිකයින්ගේ මුළු ශේෂය රුපියල් දශ ලක්ෂ 20,061.5 ක්ව පැවති අතර, එය 1986 වර්ෂය අවසානයේ පැවැති මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 3,659.4 කින් හෙවත් සියයට 22.3 කින් වැඩි වීමකි.

### ආයෝජන

සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී අරමුදල විසින් රුපියල් දශ ලක්ෂ 4,409.7 ක මුළු මුදල් ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් සහ ජාතික නිවාස ණයකර දෙකක නිදන්ගත අරමුදල් මගින් රඳවා ගනු ලැබූ රුපියල් ණය තොගවල ආයෝජනය කරන ලදී. 1986 දී ආයෝජනය කරන ලද රුපියල් දශ ලක්ෂ 6,138.0 හා සසඳා බලන කල මෙය, රුපියල් දශ ලක්ෂ 1,728.3 ක අඩු වීමකි. මේ අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 1987 දී සාමාජිකයිනට ගෙවන ලද සේ. අ. අ. ප්‍රතිලාභ ප්‍රමාණය 1986 ට වඩා සියයට 62.6 කින් වැඩි වීම හා 1986 හා සසඳා බලන කල 1987 වර්ෂයේදී ලැබුණු කල්පිරුණු ආයෝජන ප්‍රේෂණයන් අඩු වීමය. 1987 වර්ෂය තුළ කරනු ලැබූ මුළු ආයෝජන ප්‍රමාණයට කල් පිරුණු ආයෝජන හා කල් පිරුණ භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබුණ රුපියල් දශ ලක්ෂ 493.9 ක මුදලක්ද ඇතුළත් විය. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලැබූ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 4,227.7 ක් විය. මෙය රජය විසින් 1987 වර්ෂය තුළදී නිකුත් කරනු ලැබූ මුළු සුරැකුම්පත් ප්‍රමාණයෙන් සියයට 60.4 ක් විය. වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබූ මුළු මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 171.0 ක් විය. වර්ෂය තුළ විවිධ කාල සීමාවන්හිදී කල් පිරීම නිසා සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය අවසානයේදී අරමුදල සතුව භාණ්ඩාගාර බිල්පත් නොතිබිණ. 1987 දෙසැම්බර් 31 දිනට අරමුදල සතුව තිබූ මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 21,634.0 කි. මෙය, 1986 වර්ෂයේ පැවති මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 3,915.4 ක වැඩි වීමකි. මෙයට ජාතික නිවාස ණයකරවල නිදන්ගත අරමුදලේ රුපියල් ණය තොගවල ආයෝජනය කරනු ලැබූ රුපියල් දශ ලක්ෂ 10.6 ක මුදලක්ද ඇතුළත් විය.

### ආයෝජන වලින් ලැබූ ආදායම

1986 වර්ෂයේ ලද රුපියල් දශ ලක්ෂ 1,953.5 හා සසඳා බලන කල 1987 වර්ෂයේදී අරමුදලේ ආයෝජන වලින් ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 2,378.9 ක් විය. මෙය රුපියල් දශ ලක්ෂ 425.4 ක හෙවත් සියයට 21.8 ක වර්ධනයක් පෙන්නුම් කළේය.

**ප්‍රතිලාභ ගෙවීම්**

1987 වර්ෂය තුළදී සාමාජිකයිනට ප්‍රතිලාභ වශයෙන් ගෙවන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 573.6 ක් වූ අතර, 1986 වර්ෂයේ එය රුපියල් දශ ලක්ෂ 352.7 ක් විය. මෙය රුපියල් දශ ලක්ෂ 220.9 ක හෙවත් සියයට 63 ක වැඩි වීමකි. සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළ ගෙවනු ලැබූ ප්‍රතිලාභ සංඛ්‍යාව 34,530 ක් විය. ඉන්දියානු සම්භවය ලත්, පෙරළා සිය රට යන්නවුන්ගෙන් ලැබුණ හිමිකම්පෑම් 364 ක්ද මෙයට ඇතුළත් විය.

**සාමාජිකයින්ගේ ශේෂයන් සඳහා වූ පොළිය**

සෑම වර්ෂයක අවසානයට සාමාජිකයින්ගේ ගිණුමෙහි ඇති ශේෂයන් සඳහා අරමුදලේ ආදායමෙන් පොළී ගෙවිය යුතු වේ. කලින් වර්ෂයේ මෙන් 1987 වර්ෂය අවසානයට ගෙවිය යුතු වූ පොළී අනුපාතිකය සියයට 12.5 වශයෙන් නොවෙනස්ව පැවතිණි. කෙසේවුවද, අදාළ වර්ෂයේ දායක මුදල් මුළු අවුරුද්දේම සාමාජිකයාගේ බැරට පැවතුනාද නැද්ද යන්න නො සලකා වර්ෂය අවසානයේ පැවති ශේෂයට පොළිය ගණන් බලනු ලබන හෙයින් සඵල පොළී අනුපාතිකය ඉහත පොළී අනුපාතිකයට වඩා වැඩිය.

**සේ. අ. අ. ගිණුම් පොත්වල ශේෂයන් සටහන් කිරීම**

කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබූ සේ. අ. අ. ගිණුම් පොත්වල ශේෂ සටහන් කිරීම සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී දිගටම සිදු කෙරිණ. එසේ වුවද, 1986 වර්ෂය අවසානයේදී සාමාජිකයින්ගේ ශේෂ දැක්වෙන වාර්ෂික ප්‍රකාශනද කලින් පරිදිම නිකුත් කරන ලදී.

අරමුදලේ මෙහෙයවුම් කටයුතු පිළිබඳව දැනට ඇති දත්තයන් මත සැකසුනු සංසන්දනාත්මක ප්‍රකාශයක් 2.12 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

**2 . 12 සංඛ්‍යා සටහන**

**සේවක අර්ථ සාධක අරමුදල් සංඛ්‍යාන 1986 – 1987**

| ශීර්ෂය | 1986 | 1987 |
|---|---|---|
| 1. ලැබුණු දායක දීමනා (රුපියල් දහස්) .. | 2,047,962(අ) | 2,194,280(අ) |
| 2. ආයෝජන (රුපියල් දහස්) .. | 6,137,982(ආ) | 4,409,686(ආ) |
| 3. ආයෝජන වලින් ලද ආදායම (රුපියල් දහස්) .. | 1,953,489 | 2,378,882 |
| 4. ප්‍රතිලාභ ආපසු ගෙවීම් (රුපියල් දහස්) .. | 352,709 | 573,600 |
| 5. ගෙවූ ප්‍රතිලාභ සංඛ්‍යාව .. | 25,219 | 34,530 |
| 6. පොළී අනුපාතිකය (%) .. | 12·5 | 12·5 |
| 7. සාමාජික ශේෂයන් සඳහා පොළී ප්‍රතිපාදන (රුපියල් දහස්) .. | 2,050,259 | 2,507,681 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) අවිනිශ්චිත ගිණුම් වලට බැර කළ දායක මුදල් හැර.

(ආ) රජයේ සුරැකුම්පත්වල ප්‍රති ආයෝජනය කළ කල් පිරුණු ප්‍රේෂණ ඵලයන් හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ මුදල්ද ඇතුළුව.

## විනිමය පාලන

විනිමය පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජයේ නියෝජිතයා වශයෙන් මහ බැංකුව සිය කාර්‍ය්‍යයන් නොකඩවා කරගෙන යමින් සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී විනිමය පාලන ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් පහත සඳහන් වෙනස්කම් ඇති කරන ලදී.

**ආනයන :**

(අ) මයිසූර් පරිප්පු ආනයනය සඳහා ණයවර ලිපි ස්ථාපනය කිරීම පිණිස ආනයන හා අපනයන පාලක විසින් නිකුත් කරන ලද ආනයන බලපත්‍රයක් අවශ්‍ය බව බලයලත් වෙළෙඳුන්ට දන්වන ලදී. පෞද්ගලික අංශයේ ආනයනකරුවන් විසින් මයිසූර් පරිප්පු ආනයනය කිරීම පිණිස ස්ථාපිත ණයවර ලිපි, වට්ටිනාකමින් වැඩි නො කළ යුතු බවත් වලංගු භාවය අවසන් වන මුල් දිනයට වඩා දීර්ඝ නො කළ යුතු බවත් බලයලත් වෙළෙඳුන්ට දැනුම් දෙන ලදී. (අනු පිළිවෙලින් 1987.04.03 හා 1987.06.16 දින හා අංක ඊසී/14/87(බී) සහ ඊසී/24/87(බී) දරන මෙහෙයවුම් උපදෙස්)

(ආ) ශ්‍රී ලංකාවේ අපනයන සඳහා භාජන හෝ බහලුම් (තේ පෙට්ටි පතෝල) නිෂ්පාදනය සඳහා තුනී ලෑලි ආනයනය කිරීම පිණිස ණයවර ලිපි ස්ථාපිත කිරීම සඳහා ආනයන හා අපනයන පාලකගෙන් ආනයන බලපත්‍ර ලබා ගැනීම අනවශ්‍ය බව බලයලත් වෙළෙඳුන්ට දැනුම් දෙන ලදී. (1987.07.09 දින හා අංක ඊසී/29/87(බී) දරන මෙහෙයවුම් උපදෙස්)

(ඇ) පහත සඳහන් භාණ්ඩ ආනයනය කිරීම පිණිස ණයවර ලිපි ස්ථාපිත කිරීමට ආනයන හා අපනයන පාලකගෙන් ආනයන බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය බව බලයලත් වෙළෙඳුන්ට දැනුම් දෙන ලදී.

(i) සී. සී. සී. එන් අංක 07.05 (ii)

සිවිය ගැල වූ හෝ නො ගැල වූ හෝ පොත්ත ගැල වූ බෝංචි–මෑ වර්ගවලට අයත් වියළි (ලෙගුමිනස්) එළවළු. (1987.07.15 දින හා අංක ඊසී/30/87(බී) දරන මෙහෙයවුම් උපදෙස්)

(ii) සී. සී. සී. එන් අංක

25.24 — ඇස්බැස්ටෝස්

(අ) නිල් ඇස්බැස්ටෝස්

(ආ) වෙනත්

88.01 — බැලුන් හා ගුවන් නැව්

88.02 — පියාඹන යාත්‍රා, ග්ලයිඩර් හා සරුංගල් රොටෝෂූට්ස්

(අ) යාන්ත්‍රික අභිප්‍රේරණය සහිත රොටෝෂූට් සවි නො කරන ලද ගුවන් යාත්‍රා

(ආ) හෙලිකොප්ටර්

(ඇ) බර නො පැට වූ විට කිලෝ ග්‍රෑම් 2000 බර නො ඉක්මවන වෙනත් ගුවන් යානා

(ඈ) බර නොපැට වූ විට කිලෝ ග්‍රෑම් 2000 බර ඉක්මවන එ නමුත් කිලෝ ග්‍රෑම් 15,000 නො ඉක්මවන ගුවන් යානා

(ඉ) කිලෝ ග්‍රෑම් 15,000 ඉක්මවන නො පැටවූ බරක් ඇති අනෙකුත් ගුවන් යානා

88.03 — 88.01 හෝ 88.02 හෝ යන ශීර්ෂ යටතේ ගැනෙන භාණ්ඩවල කොටස්

88.04 — පැරෂුට් හා ඒවායේ කොටස් හා එහි ආම්පන්න

88.05 — කැටපුලට් හා ඊට සමාන ගුවන් යානා අහසට නැංවීමේ මෙවලම් ; ගුවන් යානා පැදවීමේ පුහුණුකරුවන්; ඉහත සඳහන් භාණ්ඩවල යම් කොටස් (1987.08.25 දින හා අංක ඊසී/34/87(බී) දරන මෙහෙයවුම් උපදෙස්)

(iii) සී. සී. සී. එන් අංක 48.01 අ මුද්‍රණ කඩදාසි

(i) රෝල් හෝ රෝද ;

(ii) වෙනත්

(1987.10.22 දින හා අංක ඊසී/41/87(බී) දරන මෙහෙයවුම් උපදෙස්)

(ඈ) කිනම් මාර්ගයකින් හෝ ඉරිඟු ආනයනය කිරීමට ණයවර ලිපි ස්ථාපනය නොකළ යුතු බව බලයලත් වෙළෙඳුන්ට දැනුම් දෙන ලදී. (1987.12.21 දින හා අංක ඊසී/48/87(බී) දරන මෙහෙයවුම් උපදෙස්)

(ඉ) ව්‍යවහාර මුදල් නෝට්ටු සම්බන්ධයෙන් එ. ජ. ඩොලර් 100 කට වැඩි හා සංචාරක චෙක්පත් හා අණකර වැනි මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් එ. ජ. ඩොලර් 1000 කට වැඩි ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් මෙරටට ගෙනෙන විදේශිකයන් පමණක් මෙරටට ගෙනෙන විදේශ ව්‍යවහාර මුදල් හෙළිදරව් කිරීමේ නියමයට අදළ කළ යුතු බව ප්‍රධාන රේගු අයකැමි වෙත දන්වන ලදී.

**අපනයන**

වටිනාකම රු. 3,000 නො ඉක්මවන මෙරට නිෂ්පාදන, තෑගි වශයෙන් හා වාණිජ්‍ය සාම්පල වශයෙන් අපනයනය කිරීමට ස්වකීය අභිමතය පරිදි අවසර දිය හැකි බව ප්‍රධාන රේගු අයකැමි වෙත දැනුම් දෙන ලදී. (ප්‍රධාන රේගු අයකැමි ආමන්ත්‍රිත 1987.09.10 දින හා අංක ඊසී/එස්ජ්/01/87 දරන ලිපිය)

**චාරිකා**

(අ) ව්‍යාපාරික කටයුතු සඳහා එතෙර බලා යන පුද්ගලයන් වෙත පහත සඳහන් වැඩි කළ විනිමය දීමනා මුද හැරීමට බලයලත් වෙළෙඳුන්ට අවසර දෙන ලදී. (1987.01.02 වැනි දින හා අංක ඊසී/01/87 (කේ) දරන මෙහෙයවුම් උපදෙස්)

(i) සමාගම් අධ්‍යක්ෂවරුන්, හවුල් ව්‍යාපාරවල හවුල්කරුවන් හා කේවල ව්‍යාපාරවල කේවල අයිතිකරුවන්;

(අ) බංගලිදේශය, භූතානය, බුරුමය, ඉන්දියාව, මාලදිවයින්, නේපාලය හා පකිස්ථානය යන රටවල වාරිකා සඳහා දින 30 ක උපරිමයකට යටත් ව දිනකට එ. ජ. ඩොලර් 100 කි.

(ආ) වෙනත් රටවල වාරිකා සඳහා දින 30 ක උපරිමයකට යටත් ව දිනකට එ. ජ. ඩොලර් 150 කි.

(ii) සමාගම්වල, හවුල් ව්‍යාපාරවල හා කේවල අයිතිකාර ව්‍යාපාරවල සේවා නියුක්තයන් සඳහා;

(අ) බංගලිදේශය, භූතානය, බුරුමය, ඉන්දියාව, මාලදිවයින්, නේපාලය හා පකිස්ථානය යන රටවල වාරිකා සඳහා දින 30 ක උපරිමයකට යටත්ව දිනකට එ. ජ. ඩොලර් 60 කි.

(ආ) වෙනත් රටවල වාරිකා සඳහා දින 30 ක උපරිමයකට යටත්ව දිනකට එ. ජ. ඩොලර් 100 කි.

(ආ) ශ්‍රී ලංකාවේ නේවාසික ශ්‍රී ලාංකිකයින් වෙත පහත සඳහන් වැඩි කළ මූලික විනිමය දීමනා මුදා හැරීමට බලයලත් වෙළෙඳුන්ට අවසර දී ඇත. (1987.09.10 දින හා අංක ඊසී/36/87 (කේ) දරන මෙහෙයවුම් උපදෙස්)

(i) බංගලිදේශය, භූතානය, බුරුමය, ඉන්දියාව, මාලදිවයින්, නේපාලය, හා පකිස්ථානය යන රටවල වාරිකා කිරීම පිණිස දෙවසරකට වරක්, වැඩිහිටියෙකුට එ. ජ. ඩොලර් 300 ක ද, වයස අවුරුදු 12 කට අඩු ළමයකුට එ. ජ. ඩොලර් 150 ක ද මූලික විනිමය දීමනාවක්;

(ii) ඉහත (i) හි සඳහන් රටවල් හැරුණු විට වෙනත් රටවල වාරිකා කිරීම පිණිස, තුන් වසරකට වරක්, වැඩිහිටියෙකුට එ. ජ. ඩොලර් 1,200 කද, වයස අවුරුදු 12 කට අඩු ළමයෙකුට එ. ජ. ඩොලර් 600 කද මූලික විනිමය දීමනාවක්;

## රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වැනි වගන්තිය ප්‍රකාර රජය වෙනුවෙන් රාජ්‍ය ණය පරිපාලනය තවදුරටත් මහ බැංකුව විසින් කරගෙන යනු ලැබීය. රජයේ සුරැකුම්පත්/ණය නිකුත් කොට පවත්වා ගෙන යාම, භාණ්ඩාගාර බිල්පත් සහ බදු සංචිත සහතික නිකුත් කිරීම සහ රජයේ විදේශ ණය සේවාකරණය බැංකුව විසින් 1987 වර්ෂයේදී ඉටු කළ ප්‍රධාන කාර්යයන් විය.

1987 අවසාන වනවිට නොපියවා තිබූ දළ හා ශුද්ධ ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 191,604.8 ක් සහ රුපියල් දශ ලක්ෂ 186,426.5 ක් විය. 1987 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 7,000 ක රුපියල් ණය නිකුත් කරන ලදී. 1987 වර්ෂය තුළදී ආපසු ගෙවන ලද මුළු රුපියල් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,172.3 ක්වූ අතර, වර්ෂය අවසාන වනවිට නොපියවා තිබූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 39,779.2 ක් විය. භාණ්ඩාගාර බිල්පත් සඳහා අනුදත් සීමාව රුපියල් දශ ලක්ෂ 35,000 ක් වශයෙන් නොවෙනස්ව පැවතිණි. වර්ෂය අවසන් වන විට නොපියවා තිබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 29,850 ක් විය. 1986 නොවැම්බර් මස සිට ආරම්භ කරන ලද සතිපතා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම 1987දී ද තවදුරටත් කරගෙන යන ලදී.

1987 වර්ෂය තුළදී ලබාගත් මැදි හා දිගු කාලීන විදේශ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,519.4 ක් වූ අතර, ණය ආපසු ගෙවීම රුපියල් දශ ලක්ෂ 4,664.1 ක් විය. විදේශ රාජ්‍ය ණය සඳහා 1987 දී ගෙවන ලද මුළු පොළී ප්‍රමාණය හා අනෙකුත් ගාස්තු රුපියල් දශ ලක්ෂ 2,487.9 ක් විය. 1987 අවසන් වනවිට නොපියවා පැවති මුළු විදේශ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 111,338.6 ක් විය.

1987 වර්ෂය තුළදී මහ බැංකුව විසින් රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව වෙනුවෙන් ණයකර නිකුත් කරන ලද අතර, මුදල් නීති පනතේ 91(1) (බී) වගන්තිය යටතේ මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම තවදුරටත් කරගෙන යන ලදී.

වර්ෂය තුලදී ශ්‍රී ලංකාවේ විදේශ ණය පිළිබඳව වූ දත්ත එක්රැස් කිරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීමේ අරමුණින් යුතුව මහ බැංකුව විසින් විදේශ ණය ගණුදෙනු සම්බන්ධයෙන් වූ දත්තයන් පරිගණක ගත කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ විදේශ ණය මෙහෙයවුම් ඒකකය වෙත තවදුරටත් සපයන ලදී.

## ප්‍රාදේශීය කාර්යාලය – මාතර

1987 වර්ෂය තුළදී මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් සිය වැඩ කටයුතු වඩා පුළුල් ක්ෂේත්‍රයක් කරා විහිදුවන ලද හෙයින් පුද්ගලයින් විශාල ප්‍රමාණයකට වඩා යහපත් සේවයක් කිරීමට පොහොසත් විය. කෘෂිකාර්මික කටයුතුවලින් බැහැර වූ කුඩා පරිමාණ ව්‍යවසායකත්වයන් සඳහා විශේෂ අවධානයක් දක්වමින් විවිධ ආර්ථිකමය කටයුතු සඳහා ආයතනික ණය දීම නංවාලීම පිණිස ප්‍රාදේශීය කාර්යාලය ඉමහත් උත්සාහයක් ගත්තේය. මීට අමතරව කාර්යාලය විසින් සිය පුහුණු කිරීම් කටයුතු හා පුද්ගලයින් විශාල සංඛ්‍යාවකට අනෙකුත් උපකාරී සේවාවන් සැපයීමද නොකඩවා කරගෙන යන ලදී.

### ප්‍රතිමූල්‍ය ණය කටයුතු

මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයන්හි සංඛ්‍යාත්මක සාරාංශයක් 2.13 වැනි සංඛ්‍යා සටහනින් දක්වේ.

### 2.13 සංඛ්‍යා සටහන

**මාතර ප්‍රාදේශීය කාර්යාලය – ප්‍රතිමූල්‍ය ණය ගණුදෙනු පිළිබඳ සංඛ්‍යාත්මක සාරාංශය**

| ණය ක්‍රමය | 1987 වර්ෂය | | 1987 අවසානයට සමුච්චිතය | |
|---|---|---|---|---|
| | ණය මුදල් සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | ණය මුදල් සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) |
| 1. ස්වයං රැකියා ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | 204 | 2,254,535 | 1,001 | 9,011,220 |
| 2. ගම් නහා සිටුවීමේ ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | 1 | 11,000 | 117 | 603,685 |
| 3. නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ ආදර්ශ යාය වී වගා ණය .. | 550(අ) | 1,047,736 | 2,138 | 4,964,629 |
| 4. ගොඩ ගොවිතැන් සඳහා ණය .. | 77 | 308,470 | 210(ආ) | 1,172,280 |
| 5. තේ පොහොර ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | — | — | 183(ඇ) | 1,266,124 |
| 6. පොල් පොහොර ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | 7 | 359,895 | 370 | 3,226,945 |
| 7. මොණරාගල අත්ට්‍රැක්ටර් සඳහා ණය .. | — | — | 4 | 155,940 |
| එකතුව | 839 | 3,981,636 | 4,023 | 20,400,823 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) 1986/87 මහ, 1987 යල හා 1987/88 මහ කන්න.
(ආ) බුත්තල හා වැල්ලවායෙහිදී කණින ලද ළිං 42 ක් ඇතුළත්ය.
(ඇ) මුලදී අනුමත කළ ණයදීම් 46 ක් පසුව ඉවත්කර ගන්නා ලදී.

## ස්වයං රැකියා සහ ගම් නගා සිටුවීමේ ණය යෝජනා ක්‍රම – ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක

### (i) ණය නිර්දේශ කිරීම සහ අනුමත කිරීම

පසුගිය වර්ෂයේ මෙන් 1987 වර්ෂය තුළදීද ප්‍රාදේශීය කාර්යාලය ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය කෙරෙහි වැඩි අවධානයක් දැක්විය. සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රමය යටතේ රුපියල් 8,000 ක් වූ එක් ණයක් පමණක් නිර්දේශ කරන ලදී. කෙසේවුවද, ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ 1987 දී බැංකුවලින් මුදල් සැපයීම සඳහා ව්‍යාපෘතීන් 251 කට රුපියල් දශ ලක්ෂ 2.1 ක ණය මුදලක් නිර්දේශ කර ඇත. වර්ෂය තුළදී ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ අදාල බැංකු සියල්ලම රුපියල් දශ ලක්ෂ 2 ක ණය වටිනාකමින් යුතු ව්‍යාපෘතීන් 204 ක් අනුමත කළේය. ප්‍රාදේශීය කාර්යාලය විසින් නිර්දේශ කරන ලද හා බැංකු විසින් අනුමත කරන ලද ණය මුදල් පිළිබඳ වැඩි විස්තර 2.14 වැනි සංඛ්‍යා සටහනින් දැක්වෙන අතර, අනුමත කරන ලද ණයවල ඒ ඒ අංශ අනුව වර්ග කිරීමක් 2.15 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

**2 . 14 සංඛ්‍යා සටහන**

**මාතර ප්‍රාදේශීය කාර්යාලය — ස්වයං රැකියා යෝජනා ක්‍රමය යටතේ නිර්දේශ කළ හා අනුමත කරන ලද ණය මුදල් — 1987**

| බැංකුව | නිර්දේශ කළ | | අනුමත කළ | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | වටිනාකම (රු.) | ව්‍යාපෘති සංඛ්‍යාව | වටිනාකම (රු.) |
| ලංකා බැංකුව .. | 137 | 1,303,590 | 115 | 1,234,500 |
| මහජන බැංකුව .. | 61 | 470,355 | 46 | 425,455 |
| ඉන්දියන් ඕවර්සීස් බැංකුව .. | 32 | 192,000 | 32 | 190,500 |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව .. | 21 | 180,750 | 11 | 104,080 |
| එකතුව .. | 251 | 2,146,695 | 204 | 1,954,535 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

**2 . 15 සංඛ්‍යා සටහන**

**මාතර ප්‍රාදේශීය කාර්යාලය — ණය අනුමත කිරීම් අංශ අනුව වර්ගීකරණය**

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | | ණය මුදල (රුපියල්) | |
|---|---|---|---|---|
| | 1987 වර්ෂය | 1987 අවසානය දක්වා (සමුච්චිත) | 1987 වර්ෂය | 1987 අවසානය දක්වා (සමුච්චිත) |
| 1. කෘෂිකර්මය .. | 59 | 326 | 678,080 | 2,568,930 |
| 2. කර්මාන්ත .. | 90 | 529 | 695,455 | 3,303,030 |
| 3. සේවා, ගොවිපල බලශක්තිය ආදිය .. | 55 | 263 | 592,000 | 3,731,945 |
| එකතුව .. | 204 | 1,118 | 1,965,535 | 9,614,905 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

### (ii) ණය ආපසු ගෙවීම්

1987 අවසානයට සම්පූර්ණයෙන්ම ආපසු ගෙවන ලද මුළු ණය සංඛ්‍යාව හා ප්‍රමාණය පිළිවෙලින් 378 ක් හා රුපියල් දශ ලක්ෂ 2.8 ක් වන පරිදි සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 1.1 ක් වන ණය 123 ක් සම්පූර්ණයෙන්ම ගෙවා නිමකර ඇත. මෙය අනුමත කරන ලද මුළු ණය මාලාවෙන් සියයට 22.3 ක් විය.

### නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (න.ස.ග්‍රා.ණ.යෝ.ක්‍ර.) යටතේ දෙන ලද වී වගා ණය

ප්‍රාදේශීය කාර්යාලය, වී වගා ණය සම්බන්ධයෙන් ආදර්ශ යාය ක්‍රමය තවදුරටත් පවත්වා ගෙන ගියේය. වර්ෂය තුළදී මෙම ක්‍රමය යටතේ අකුරැස්ස, හක්මන, දෙවිනුවර, කඹුරුපිටිය සහ මාතර යන ඡන්ද කොට්ඨාශයන්හි යාය සංවිධානයන් සඳහා ණය දෙනු ලැබිණි. 2.16 වැනි සංඛ්‍යා සටහනින් මෙම ණය පිළිබඳ විස්තර දැක්වේ. න.ස.ග්‍රා.ණ.යෝ.ක්‍රමයෙහි කොන්දේසි අනුව වර්ෂය තුළදී ණය කිහිපයක් ප්‍රතිලේඛනගත කිරීම සඳහා නිර්දේශ කරන ලදී. ප්‍රදේශයේ ගොවීන් විශාල සංඛ්‍යාවකට න.ස.ග්‍රා.ණ.යෝ. ක්‍රමය පිළිබඳව වැඩි දැනුමක් ලබාදීම සඳහා ප්‍රාදේශීය කාර්යාලය විසින් සම්මන්ත්‍රණ කිහිපයක්ද සංවිධානය කරන ලදී.

**2 . 16 සංඛ්‍යා සටහන**

**මාතර ප්‍රාදේශීය කාර්යාලය – ආදර්ශ යාය ණය මුදල්**

| මැතිවරණ කොට්ඨාශය | 1986/87 මහ | | | 1987 යල | | | 1987/88 මහ | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර ගණන | ගොවීන් සංඛ්‍යාව | අනුමත-කල ණය (රුපි.) | අක්කර ගණන | ගොවීන් සංඛ්‍යාව | අනුමත-කල ණය (රුපි.) | අක්කර ගණන | ගොවීන් සංඛ්‍යාව | අනුමත-කල ණය (රුපි.) |
| මාතර .. | — | — | — | — | — | — | 13 | 9 | 27,794 |
| අකුරැස්ස .. | — | 73 | 108,523 | 84 | 54 | 89,076 | 66 | 46 | 62,977 |
| හක්මන .. | — | 57 | 86,224 | 127 | 105 | 185,244 | 157 | 131 | 264,989 |
| කඹුරුපිටිය | — | 39 | 103,334 | 35 | 11 | 40,618 | 41 | 15 | 59,412 |
| දෙවිනුවර .. | — | 10 | 19,545 | — | — | — | — | — | — |
| එකතුව .. | — | 179 | 317,626 | 246 | 170 | 314,938 | 277 | 201 | 415,172 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

### තේ සහ පොල් පොහොර ණය ක්‍රමය

මෙම ණය ක්‍රම දෙකෙහි ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාලය විසින් අඛණ්ඩ උත්සාහයක් ගනු ලැබුවද, 1987 දීද ඒවායේ ක්‍රියාකාරිත්වය අපේක්ෂිත තත්ත්වයට වඩා බෙහෙවින් පහත්ව පැවතිණ. පොල් පොහොර ණය ක්‍රමය යටතේ ප්‍රදේශයේ වගාකරුවන් සඳහා 1987 වසරේදී දෙන ලද්දේ රුපියල් 3,59,895 ක් වූ ණය 7 ක් පමණි. ඒ අනුව 1987 අවසානය වන විට දෙන ලද එබදු ණයවල මුළු සංඛ්‍යාව හා ප්‍රමාණය 370 ක් හා රුපියල් දශ ලක්ෂ 3.2 ක් විය. වර්ෂය තුළදී තේ පොහොර ණය ක්‍රමය යටතේ ණය දී නොමැත.

### භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම

1987 දී ප්‍රාදේශීය කාර්යාලය විසින් රුපියල් දශ ලක්ෂ 12 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් අලෙවි කරන ලදී.

### ප්‍රාදේශීය නිෂ්කාශන ආයතනය

ප්‍රාදේශීය නිෂ්කාශණ ආයතනය විසින් වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 1,033.2 ක් වටිනා චෙක්පත් 1,39,305 ක් නිෂ්කාශණය කරන ලදී.

## ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුරය

1987 වර්ෂය තුළදී අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් දිස්ත්‍රික්කය ඇතුළත විවිධ කටයුතු සමූහයක් සඳහා කෙටි කාලීන මෙන්ම මැදි හා දිගු කාලීන ණය පහසුකම් නංවාලීම සම්බන්ධයෙන් වූ සිය කටයුතු තවදුරටත් කරගෙන ගියේය. ප්‍රාදේශීය කාර්යාලය ණය ගැනුම් කරුවනට මූල්‍ය, කළමණාකරන සහ කාර්මික අංශයන් හා සම්බන්ධ මහ පෙන්වීම සහ ව්‍යාප්ති කටයුතු පිළිබඳව සහායවීම වඩාත් පුළුල් ලෙස කරගෙන ගියේය. ජනගහනයෙන් වැඩි කොටසක් හසුවන පරිදි පුහුණු කිරීමේ වැඩ සටහන් ව්‍යාප්ත කරන ලදී. මහ බැංකුවේ වැඩ සටහන් යටතේ 2,000 කට අධික පිරිසක් පුහුණු වීමේ පහසුකම් ලබා ඇත. ජනතාව වෙත සංවර්ධන බැංකු කටයුතු පිළිබඳ පණිවිඩය ගෙන යාමේ උත්සාහයක් වශයෙන් වර්ෂය තුළදී ග්‍රාමීය මට්ටමින් රැස්වීම්, සාකච්ඡා සහ වැඩමුළු ගණනාවක් පවත්වන ලදී. සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය කාන්තා කාර්යාංශය, යෞවන කටයුතු හා රැකී රක්ෂා පිළිබඳ අමාත්‍යාංශය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය වැනි අනෙකුත් ආයතනවල සිය පුහුණු කිරීම් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ද මහ බැංකුව උපකාරී විය.

පිළිවෙලින් දෙවන වර්ෂයටද කෘෂිකාර්මික තරඟයක් පවත්වන ලද අතර, එමඟින් පුහුණු කිරීම් වැඩ සටහන්වලට සහභාගි වූ ණය ගැනුම් කරුවන් ලද වාසි පැහැදිලිවම දක්නට ලැබුණි. මෙම තරඟ මගින් හොඳ ආදායමක් ලබා ගැනීම සඳහා සූක්ෂම වගා ක්‍රම අනුගමනය කිරීමට ගොවීන් විශාල සංඛ්‍යාවක් පොළඹවා ඇත.

### ප්‍රතිමූල්‍ය ණය කටයුතු

මැදි හා දිගු කාලීන ණය අරමුදල යටතේ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රතිමූල්‍ය ණය කටයුතු පිළිබඳ සාරාංශයක් 2.17 වැනි සංඛ්‍යා සටහනින් දක්වේ.

**2 . 17 සංඛ්‍යා සටහන**

**අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය – ප්‍රතිමූල්‍ය ණය ගණුදෙනු**

| අංශය | බැංකුවලට නිර්දේශිත ව්‍යාපෘති ගණන | නිර්දේශිත මුදල (රුපි. දහස්) | බැංකු විසින් අනුමත කළ ව්‍යාපෘති ගණන | අනුමත කළ මුදල (රුපි. දහස්) |
|---|---|---|---|---|
| කෘෂිකර්මය .. | 1,097 | 12,761 | 381 | 4,368 |
| පශු සම්පත් .. | 589 | 3,025 | 154 | 901 |
| කුඩා කර්මාන්ත .. | 324 | 3,396 | 188 | 1,848 |
| සේවා .. | 150 | 1,122 | 83 | 816 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

පසුගිය වර්ෂයේ ප්‍රගතිය හා සසඳා බලන කල, 1987 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාලයට වඩා අධික ණය ප්‍රමාණයක් සම්බන්ධවන ව්‍යාපෘතීන් විශාල සංඛ්‍යාවක් නිර්දේශ කිරීමට හැකි විය.

මෙයට අමතරව න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය යටතේ වී සහ විවිධ අතුරු ආහාර භෝග සඳහා කෙටි කාලීන නිෂ්පාදන ණය ලබා දීම පිණිස ප්‍රාදේශීය කාර්යාලය වැදගත් මෙහෙයක් ඉටු කළේය. 1987 වගා වර්ෂයේදී අක්කර 1,646 ක් සම්බන්ධයෙන් රුපියල් දශ ලක්ෂ 3.3 ක් වූ එබඳු ණය 696 ක් සඳහා ප්‍රාදේශීය කාර්යාලයේ අනුග්‍රහය ලැබුණි. මෙම ණය දෙන ලද්දේ ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ ශාඛාවන් මඟින් සහ අනුරාධපුර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව මඟින්ය. වර්ෂය තුළදී තවදුරටත් පැහැදිලි වූ කරුණක් නම් මනාව සුපරීක්ෂාකාරී වීමෙන්, ණය ලබා ගන්නා ගොවීන් දැනුවත් කිරීමෙන් සහ අඛණ්ඩ මඟ පෙන්වීම තුළින් වඩා යහපත් ණය ආපසු අයකර ගැනීමේ අනුපාතිකයක් සහිතවද ණය දීම වැඩි කළ හැකි බවයි.

### මැදි හා දිගු කාලීන ව්‍යාපෘතීන්හි ක්‍රියාකාරිත්වය

ප්‍රාදේශීය කාර්යාලය පිහිටුවීමෙහි ප්‍රධාන අරමුණ වූයේ ආර්ථිකමය ක්‍රියාවන් සඳහා ආයතනික ණයදීම වැඩි කිරීම මඟින් නිෂ්පාදනය, ආදායම සහ රැකියා අවස්ථාවන් වැඩි කිරීමය. 1987 අවසානය වනවිට ප්‍රාදේශීය කාර්යාලය විසින් තෝරා ගන්නා ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 2,160 ක් වූ අතර, ඉන් 806 ක් ණය දෙන බැංකු මඟින් මූල්‍යකරණය සඳහා අනුමත කෙරිණි. ඉහත සඳහන් අරමුණු අනුව සළකා බලන කල ක්‍රියාත්මකව පවත්නා ව්‍යාපෘතීන් විසින් දිරිගන්වන සුළු ප්‍රතිඵල දක්වා ඇත.

### ආදයම සහ සේවා නියුක්තිය

වර්ෂය තුළදී ක්‍රියාත්මකව පවත්නා ව්‍යාපෘතීන් මඟින් උපදවන ලද මුළු ආදායම රුපියල් දශ ලක්ෂ 27.5 ක් වශයෙන් ගණන් බලා ඇත. ඒ ඒ අංශ අනුව විග්‍රහ කර බලන විට පෙනීයන්නේ කෘෂිකාර්මික ව්‍යාපෘතීන් විසින් ඉහළ ස්ථාවර ආදායමක් උපදවා ඇති බවය. වඩා ඉහළ ආදායමක් උපයා ඇති ඉතාමත් ක්‍රියාශීලී ගොවීන් අත්හැර සළකා බලන කල සෑම කන්නයකදීම, විශේෂයෙන් කන්නයෙන් බාහිර කාලවල, කණින ලද ළිංවලින් ජලය ලැබ අක්කර 1–2 දක්වා ඉඩම්වල මුදල් භෝග වැවීමෙන් ව්‍යාපෘතීන් වැඩි කොටසක් රුපියල් 10,000 ත් 15,000 ත් අතර සාමාන්‍ය ආදායමක් ලබා ඇත.

රැකියාවන් උත්පාදනය කිරීමෙහිදී කෘෂිකාර්මික ව්‍යාපෘතීන්ට වඩා කුඩා පරිමාණ කාර්මික හා සේවා අංශ ව්‍යාපෘතීන් වැඩි හැකියාවක් දක්වා ඇත. හොඳින් පාලනය වන සමහර කාර්මික ව්‍යාපෘතීන්හි එක් ව්‍යාපෘතියක සාමාන්‍ය සේවා නියුක්තිය පුද්ගලයන් අට දෙනෙක් විය. ආදායම් සහ රැකියා උත්පාදනය පිළිබඳ විස්තර 2.18 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

### 2 . 18 සංඛ්‍යා සටහන

**අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය – ඇස්තමේන්තුගත ආදයම හා සේවා නියුක්තිය**

| අංශය | ක්‍රියාත්මක වූ ව්‍යාපෘති සංඛ්‍යාව | මාසික ආදයම (රුපියල්) | වාර්ෂික ආදයම (රුපියල්) | සේවා නියුක්තිය (පුද්ගල සංඛ්‍යාව) |
|---|---|---|---|---|
| කෘෂිකර්මය .. | 365 | 1,046,100 | 12,553,200 | 629 |
| පශු සම්පත් .. | 118 | 51,800 | 621,600 | 77 |
| කුඩා කර්මාන්ත .. | 176 | 994,550 | 11,934,600 | 328 |
| සේවා අංශය .. | 81 | 198,100 | 2,377,200 | 87 |
| එකතුව .. | 740 | 2,290,550 | 27,486,600 | 1,121 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

### ණය ආපසු ගෙවීම

මැදි හා දිගු කාලීන ණය වැඩ පිළිවෙලෙහි ණය ආපසු ගෙවීම පිළිබඳ සාරාංශයක් 2.19 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2 . 19 සංඛ්‍යා සටහන**

**අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය – මැදි හා දිගු කාලීන ණය මුදල් ආපසු ගෙවීම**

(ප්‍රමාණය රුපියල් දහස්)

| අංශය | බැංකු මගින් මූල්‍ය පහසුකම් සළසන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | ණය මුදල් ප්‍රමාණය | 1987 අවසානයට ආපසු අයවිය යුතු මුළු මුදල | 1987 අවසානයට ආපසු ගෙවූ මුළු මුදල | හිඟ හිටි මුළු මුදල |
|---|---|---|---|---|---|
| කෘෂිකර්මය .. | 365 | 4,205 | 1,422 | 1,356 | 145 |
| පශු සම්පත් .. | 118 | 659 | 33 | 296 | 43 |
| කර්මාන්ත .. | 176 | 1,609 | 634 | 534 | 108 |
| සේවා .. | 81 | 537 | 266 | 231 | 34 |
| එකතුව .. | 740 | 7,010 | 2,661 | 2,417 | 330 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

කෘෂිකාර්මික අංශයේ ව්‍යාපෘතීන් සියයට 90 කටත් අධික ණය ආපසු ගෙවීමේ අනුපාතිකයක් වාර්තා කර ඇති අතර, සේවා අංශය සියයට 87 ක ණය ආපසු ගෙවීමේ අනුපාතිකයක් වාර්තා කර ඇත. කර්මාන්ත සහ සත්ව නිෂ්පාදන කටයුතු සඳහා දෙන ලද ණයවල ආපසු ගෙවීමේ අනුපාතිකයන් පිළිවෙලින් සියයට 84 ක් සහ සියයට 80 ක් විය. සත්ව නිෂ්පාදන කටයුතු සඳහා දෙන ලද ණය ආපසු අයකර ගැනීමේ අනුපාතිකය අඩු වීමට හේතු වූ ප්‍රධාන සාධකය වූයේ කුකුලන් ඇති කිරීම සඳහා වූ ව්‍යාපෘතීන් අසාර්ථක වීමය.

### ගොවීන් පුහුණු කිරීමේ වැඩ සටහන්, සම්මන්ත්‍රණ/වැඩමුළු

වඩා හොඳ තාක්ෂණ ක්‍රම භාවිතය මගින් වගා කටයුතු සූක්ෂම කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරෙමින් ප්‍රාදේශීය කාර්යාලය විසින් නිතර විවිධ පුහුණු කිරීමේ වැඩ සටහන් සකස් කර ක්‍රියාත්මක කරන ලදී. සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී දිස්ත්‍රික්කයේ විවිධ ස්ථානවල ගොවීන් 500 කට අධික ප්‍රමාණයකට වාසි සැලසෙන එබඳු වැඩ සටහන් 9 ක් පවත්වන ලදී. මීට අමතරව ජනතාවගෙන් වැඩි කොටසකට ආයතනික ණය පහසුකම් ලබා ගැනීමට ඇති ඉඩකඩ වැඩි දියුණු කිරීම සහ ග්‍රාමීය ප්‍රදේශවල සංවර්ධනයට ඇති හැකියාව පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා වර්ෂය තුළදී ගම්බද ප්‍රදේශවල රැස්වීම් 65 කටත් අධික ප්‍රමාණයක් සංවිධානය කරන ලදී.

### භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම

සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී දිස්ත්‍රික්කයේ වූ බැංකු විසින් භාණ්ඩාගාර බිල්පත් සඳහා දායක වූ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 230.2 ක් විය. පසුගිය වර්ෂයේ දායකවීම හා සමඟ සසඳා බලන කල මෙය කැපීපෙනෙන වැඩි වීමකි. මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ මහජන බැංකුවය.

**ප්‍රාදේශීය නිෂ්කාශණ ආයතනය**

ප්‍රාදේශීය කාර්යාලයේ වූ නිෂ්කාශණ ආයතනය විසින් ප්‍රදේශයේ බැංකුවලට නිෂ්කාශණ පහසුකම් සැළසීම දිගටම කරගෙන යන ලදී. වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 242 ක වටිනාකමකින් යුත් චෙක්පත් නිෂ්කාශණය කර ඇත.

## ප්‍රාදේශීය කාර්යාලය – මාතලේ

1987 වර්ෂය තුළදී මාතලේ ප්‍රාදේශීය කාර්යාලය ග්‍රාමීය ණය පහසුකම් නංවාලීම මගින් ග්‍රාමීය සංවර්ධනය ඇති කිරීමේ අරමුණින් සිය කටයුතු තවදුරටත් කරගෙන ගියේය. ව්‍යාපෘතීන් හඳුනා ගැනීම සහ බැංකු මූල්‍යකරණය සඳහා ව්‍යාපෘතීන් ඇගැයීම මත පදනම් වූ නිර්දේශ කිරීම්, පුහුණු කිරීමේ වැඩසටහන් පවත්වාගෙන යාම සහ බැංකුව විසින් මූල්‍යකරණය කරන ලද ව්‍යාපෘතීන් පිළිබඳව පරීක්ෂාකාරී වීම එහි කටයුතුවලට අයත් විය. ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීමට සහාය වීමේ අරමුණ ඇතිව වර්ෂය තුළදී ග්‍රාමීය සමාජයෙහි වඩා දුර්වල කොටස් කෙරෙහි වැඩි අවධානයක් දක්වන ලදී. සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍ය ණය ක්‍රම හා සම්බන්ධ ණය දීමේ කටයුතු පිළිබඳ සාරාංශයක් 2.20 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

**2 . 20 සංඛ්‍යා සටහන**

**මාතලේ ප්‍රාදේශීය කාර්යාලය – 1987 ප්‍රතිමූල්‍ය ණය කටයුතුවල සාරාංශය**

| ණය ක්‍රමය | බැංකු වෙත යොමු කරන ලද ප්‍රතිලාභීන්/ඒකක සංඛ්‍යාව | නිර්දේශිත ණය ප්‍රමාණය (රුපියල්) |
|---|---|---|
| 1. නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය – 87/88 යල/මහ .. | 1,678 | 7,309,538 |
| 2. ස්වයං රැකියා ණය ක්‍රමය – මාතලේ, මහනුවර හා කෑගල්ල .. | 221 | 1,480,085 |
| 3. කිරි පට්ටි සංවර්ධන ණය ක්‍රමය .. | 45 | 344,200 |
| 4. දිප ව්‍යාප්ත ගොවිපල යන්ත්‍ර ණය ක්‍රමය .. | 20 | 888,600 |
| 5. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ණය වැඩ සටහන (මාතලේ දිස්ත්‍රික්කය) .. | 1 | 30,000 |
| 6. මැදි හා දිගු කාලීන කර්මාන්ත ණය ක්‍රමය .. | 1 | 32,000 |
| එකතුව .. .. | 1,966 | 10,084,423 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

**යල වගා කන්නය – 1987**

1986/87 මහ කන්නය තුළදී වී වගාව දැඩි නියඟයෙහි අහිතකර බලපෑමට හසුවීම නිසා බොහෝ ගොවීන් ඔවුන්ගේ බැංකු ණය ආපසු ගෙවීමට නොහැකිව 1987 යල කන්නයේදී අළුත් ණය සඳහා සුදුසුකම් නොලැබීය. කෙසේවුවද, ණය ලැබීමට සුදුසුකම් ඇති ගොවීන් සඳහා මෙම කන්නය තුළදී වී වගා ණය දීම වැඩි කිරීම පිණිස ප්‍රාදේශීය කාර්යාලය විසින් උත්සාහ ගනු ලැබීය. මෙම කන්නයේදී කාර්යාලය විසින් දිස්ත්‍රික්කය තුළ ණය කඳවුරු 16 ක් සංවිධානය කරන ලද අතර වී සහ අතුරු ආහාර භෝග වගාව සඳහා රුපියල් දශ ලක්ෂ 2.6 ක් වන ණය 682 ක් නිර්දේශ කර ඇත. 1987 යල කන්නයේ ණය ආපසු අය කර ගැනීමේ අනුපාතිකය 1987 අවසානය වනවිට සියයට 67.5 ක් වශයෙන් ගණන් බලා ඇත.

**මහ වගා කන්නය – 1987/88**

1987/88 මහ කන්නය තුළදී ණය කළවුරු සංඛ්‍යාව 21 දක්වා වැඩි කරන ලද අතර මෙම කළවුරු වඩා පුළුල් බිම් ප්‍රදේශයක් කරා පැතිරිණි. මෙම කළවුරු සමහරක් මගින් විශේෂයෙන්ම දිස්ත්‍රික්කයේ දුර බැහැර දුෂ්කර ප්‍රදේශවල ගොවීන්ට වාසි සැලසුනු අතර බැංකු වලින් ණය ලබා ගැනීමෙහිදී දැරීමට සිදු වූ ගණුදෙනු වියදම් අඩුකර ගැනීමෙහිලා උපකාරී විය. 1987/88 මහ කන්නයේදී න. ස. ග්‍රා. ණ. යෝ. ක්‍රමය යටතේ වී සහ අතුරු ආහාර භෝග වගා කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 4.7 ක් වන ණය 997 ක් ලබා දී ඇත.

**මැදි හා දිගුකාලීන ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය**

ප්‍රාදේශීය කාර්යාලය, මැදි හා දිගු කාලීන ප්‍රතිමූල්‍ය ණය ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කර පරීක්ෂාකාරීවීම තවදුරටත් කරගෙන ගියේය. මේ අතුරින් සවයං රැකියා ණය ක්‍රමය සමහරවිට වඩාත්ම වැදගත් විය. මෙම ක්‍රමයෙහි ප්‍රධාන අරමුණු වූයේ ප්‍රදේශය තුළ රැකියා මට්ටම, නිෂ්පාදනය සහ ආදායම් නැංවීමය. වර්ෂය තුළදී ස්වයං රැකියා 502 ක් අනුමත කරන ලද අතර බැංකු විසින් මූල්‍යකරණය සඳහා නිර්දේශ කරන ලදී. මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් දෙන ලද සහයෝගයට අමතරව කාර්යාලය විසින් කුඩා ව්‍යවසායයන්හි අයිතිකරුවනට ඔවුන්ගේ අලෙවි කිරීම් සහ අමු ද්‍රව්‍ය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම සඳහා සහාය වීමට උත්සාහ කෙරිණි. අනෙකුත් මැදි හා දිගු කාලීන ණය ක්‍රම අතර කිරිපට්ටි සංවර්ධන ණය ක්‍රමය සහ දීප ව්‍යාප්ත කෘෂි යන්ත්‍ර ණය ක්‍රමය වැදගත් විය. මෙම සෑම ණය ක්‍රමයකම ණය ආපසු අය කර ගැනීමේ අනුපාතිකය සියයට 99 ක් පමණ විය.

**පුහුණු කිරීම් සහ ප්‍රචාරක වැඩ කටයුතු**

ස්වයං රැකියා ණය ක්‍රමය සහ අනෙකුත් විවිධ බැංකු පහසුකම් පිළිබඳව ණය ගැනීමට ඉදිරිපත් විය හැකි අය දැනුවත් කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාලය විසින් රැස්වීම් සහ සම්මන්ත්‍රණ කිහිපයක් සංවිධානය කරන ලදී. කුඩා කර්මාන්ත, කුකුළන් ඇති කිරීම සහ කිරිපට්ටි පාලනය පිළිබඳ පුහුණු කිරීමේ වැඩසටහන් කිහිපයක්ද පවත්වන ලදී.

**භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම**

සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාලයට රුපියල් දශ ලක්ෂ 219.5 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් අලෙවි කිරීමට හැකි විය. ඒ ඒ දිස්ත්‍රික්ක අනුව බිල්පත් නිකුත් කර ඇති ආකාරය 2.21 සංඛ්‍යා සටහනින් දැක්වේ.

**2 . 21 සංඛ්‍යා සටහන**

**මාතලේ ප්‍රාදේශීය කාර්යාලය – භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම – 1987**

| දිස්ත්‍රික්කය | මුදල (රුපියල්) |
|---|---|
| මහනුවර .. .. | 164,961,000 |
| මාතලේ .. .. | 53,715,000 |
| කෑගල්ල .. .. | 850,000 |
| එකතුව .. .. | 219,526,000 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**ප්‍රාදේශීය නිෂ්කාශණ ආයතනය**

1987 වර්ෂය තුළදී මාතලේ ප්‍රාදේශීය නිෂ්කාශණ ආයතනය විසින් රුපියල් දශ ලක්ෂ 441.6 ක මුළු වටිනාකමක් ඇති චෙක්පත් 79,687 ක් නිෂ්කාශණය කරන ලදී. 1987 අගෝස්තු මාසයේදී මහනුවර ප්‍රාදේශීය නිෂ්කාශණ ආයතනය සිය වැඩ කටයුතු ආරම්භ කළ අතර 1987 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 1,369.0 ක් වටිනා චෙක්පත් 1,36,100 ක් නිෂ්කාශණය කර තිබුණි.

## ප්‍රකාශන

මුදල් නීති පනතේ 35 (1) වැනි වගන්තිය ප්‍රකාර, 1986 වර්ෂය සඳහා වූ මහ බැංකු වාර්තාව ගරු මුදල් හා ක්‍රම සම්පාදන ඇමති තුමා වෙත පිළිගන්වන ලදී. එම වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රවනතාවයන් හා සංවර්ධනයන් පිළිබඳ වඩාත් පුළුල් විග්‍රහයක් කෙරෙන 1986 වර්ෂයේ ආර්ථික විවරණයද 1987 සැප්තැම්බර් මාසයේදී නිකුත් කෙරුණි. 1987 වර්ෂයේ ප්‍රථම භාගයේ කටයුතු පිළිබඳ කෙටි සමාලෝචනයක් ''ආර්ථික හැඩගැස්ම—1987 ප්‍රථම භාගය'' යන මැයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ප්‍රකාශයට පත් විය.

වර්ෂය තුළදී තවත් ප්‍රකාශන කිහිපයක්ම නිකුත් කරන ලදී. මේ අතර ''ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජමය සංඛ්‍යාන–IX වැනි වෙළුම–1986'' සහ 1987 වර්ෂයේ ''ආර්ථික හා සමාජමය දත්ත ෆෝල්ඩරයද'' විය. මෙම ප්‍රකාශනවල ප්‍රධාන ආර්ථික විචල්‍යයන් පිළිබඳ මූලික දත්ත අඩංගු වී ඇත. ''ශ්‍රී ලංකාවේ මිළ හා වැටුප් සංඛ්‍යාන–1985'' හා ''මෑත කාලීන ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල්, 1938–1985'' යන ප්‍රකාශනද වර්ෂය තුළදී නිකුත් කෙරුණි. වර්ෂය තුළදී නිකුත් කළ අනෙකුත් ප්‍රකාශන කිහිපයක් නම් ''ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවල ගණුදෙනුකාර සේවා පිළිබඳ සමීක්ෂණයේ වාර්තාව'', ''1983/84 සිට 1985/86 දක්වා ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතු හා සැළසුම්ගත ආයෝජනයන් පිළිබඳ 1985 දී කළ සමීක්ෂණයේ වාර්තාව'' සහ ''මාණ්ඩලික පත්‍රිකා–14 වැනි වෙළුම–1 වෙනි හා 2 වෙනි කලාප'' ද වේ. ''යුනිසෙෆ්'' ආයතනයේ සහයෝගීත්වයෙන් මහ බැංකුව විසින් ''ශ්‍රී ලංකාවේ දිළිඳු භාවය පිටු දැකීම'' යන මැයෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලද අතර, ''ශ්‍රී ලංකාවේ දිළිඳු භාවය පිටු දැකීම'' පිළිබඳ වාර්තාවද ප්‍රකාශයට පත් කෙරුණි. තවද, ''ණය විවරණිකාව''–4 වැනි කලාපය, ''සැබෑවූ සිහිනයක්'' මැයෙන් සිංහල චිත්‍ර කතා පොතක් සහ ''කාලීන පුවත්'' 15, 16 සහ 17 වැනි කලාපද මෙම වර්ෂයේදී නිකුත් විය. විමසුමට ලක්වන වර්ෂය තුළදී ''විවරණිකාව'', සිංහල බසින් මාසිකව පලවන ''සටහන'' හා ඉංග්‍රීසි බසින් පලවන ''නිව්ස් සර්වේ'' (News Survey) ප්‍රකාශයට පත් කිරීමද බැංකුව විසින් නොකඩවා සිදු කෙරුණි.

**පුස්තකාලය**

පුස්තකාලය, බැංකු නිලධාරීන් විසින් තොරතුරු ලබා ගැනීම සඳහා පරිශීලනය කරනු ලබන ස්ථානයක් වශයෙන් ජනප්‍රියව පැවතුණි. සීමාසහිත ප්‍රමාණයක් මුත්, බාහිර පුද්ගලයන්ටද මෙම ස්ථානයෙහි ඉඩ සළසා ඇත. ආර්ථික විද්‍යාව හා ඊට අනුබද්ධිත විෂයයන් යටතට ගැනෙන පොත් හා ප්‍රකාශනයන් 1,263 ක් වර්ෂය තුළදී පුස්තකාලයට එක් විය.

## සම්මන්ත්‍රණ

1987 වර්ෂය තුළදී පහත සඳහන් සුප්‍රකට අර්ථශාස්ත්‍රඥයින් විසින් මහ බැංකුවේ නිලධාරීන්ට වැදගත්කමක් ඇති මාතෘකා යටතේ සම්මන්ත්‍රණ පවත්වන ලදී.

1. හාවඩ් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ශාන්ති දේවරාජන් විසින් '' ගැලපීම්වලින් තොර වර්ධනය—1973 සිට 1982 තායිලන්තය '' මාතෘකාව යටතේද,

2. ලෝක බැංකුවේ, ආචාර්ය සරත් රාජපතිරණ විසින් '' කාර්මිකකරණය සහ විදේශ වෙළෙඳාම '' යන මාතෘකාව යටතේ සහ

3. නිව්යෝර්ක්හි සිටිකෝප් ආයෝජන බැංකුවේ ආචාර්ය මයිකල් ඇම්ස්ලිම් සහ සෙත් මොරෝවිට්ස් මහතා විසින් '' පුද්ගලික අංශයට පවරාදීම '' යන මාතෘකාව යටතේ සම්මන්ත්‍රණ පවත්වන ලදී.

'' ශ්‍රී ලංකාවේ මුදල් සැපයුමෙහි පොළී නම්‍යතාව '' යන මාතෘකාව යටතේ මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ඩබ්ලිව්. ඒ. විජේවර්ධන මහතා විසින්ද සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

## පර්යේෂණ කටයුතු

සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී මහ බැංකුව විසින් ආර්ථිකයේ විවිධ අංශයන් හා සම්බන්ධ පර්යේෂණ කටයුතු සඳහා සැළකිය යුතු අවධානයක් දැක්වීය. 1987 දී මහ බැංකුවේ නිලධාරීන් විසින් පහත සඳහන් පර්යේෂණ ලිපි අවසන් කරන ලදී.

1. '' ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපලක් සංවර්ධනය කිරීම.''
2. '' ශ්‍රී ලංකාව සඳහා සාර්ව—සංඛ්‍යාන ආර්ථිකමය ආකෘතියක් : ශ්‍රී ලංකාව සඳහා වූ ආකෘතිය , එස්කැප්—සම්බන්ධතාවය ''
3. '' ප්‍රධාන මුදල් වර්ගවල විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම් මගින් ගෙවුම් ශේෂය කෙරෙහි ඇතිවෙන බලපෑම: ශ්‍රී ලංකාවේ තත්ත්වය 1977 සිට 1986 ''
4. '' ආදයම් ව්‍යාප්ති රටාව කුටුම්භ අංශයේ විවිධ බලශක්ති වර්ග සඳහා වූ ඉල්ලුම කෙරෙහි බලපාන ආකාරය ''
5. '' 1984 තීරු ගාස්තු සංශෝධන දේශීය කර්මාන්ත කෙරෙහි බලපෑ ආකාරය ''
6. '' බඳු ධාරිතා ආකෘතියක බඳු අනුපාත පිළිබඳ විග්‍රහයක් ''
7. '' ශ්‍රී ලංකාවේ මුදල් සැපයුමෙහි පොළී නම්‍යතාව ''
8. '' තෝරාගත් ආර්ථික විචල්‍යයන් කෙරෙහි මහ බැංකු සුරැකුම්පත්වල බලපෑම ඇගැයීම සඳහා වූ ආකෘතියක් ''
9. '' ශ්‍රී ලංකාවේ අන්තර් කර්මාන්ත වෙළෙඳාම ''
10. '' ශ්‍රී ලංකාවේ නිවාස අවශ්‍යතාවන් සපුරාලීම සඳහා සම්පත් ''
11. '' බඳු ධාරිතා ආකෘතියක බඳු අනුපාත පිළිබඳ විග්‍රහයක්—ශ්‍රී ලංකාවේ තත්ත්වය—1970 සිට 1985 ''

## සමීක්ෂණ

### පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණය - 1986/87

1986 ඔක්තෝබර් මාසයේදී ආරම්භ කෙරුණු පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණයේ ක්ෂේත්‍ර දත්ත රැස් කිරීමේ කටයුතු බැංකුව විසින් සම්පූර්ණ කරන ලදී. මෙම සමීක්ෂණය මාස 12 ක් තුළ වාර හතරකදී පවත්වන ලදී. සමීක්ෂණයේ ප්‍රධාන පරමාර්ථය වූයේ දිවයිනෙහි කුටුම්භ අංශයේ පාරිභෝගික මූල්‍ය හා සමාජයීය ආර්ථික තත්ත්වයන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ලබා ගැනීමය.

### ව්‍යාපාරික කටයුතු හා සැළසුම්ගත ආයෝජනයන් පිළිබඳ සමීක්ෂණය

ආයෝජන ව්‍යුහය, ආයෝජන දිශාව, සැලසුම්ගත ප්‍රමාණය, අරමුදල්වල ප්‍රභවයන් හා යොදාගත් මාර්ග සහ ආයෝජන ප්‍රමාණය නිසැකව දැන ගැනීම අපේක්ෂා කරමින් '' ව්‍යාපාරික කටයුතු හා සැළසුම්ගත ආයෝජනයන් පිළිබඳ සමීක්ෂණය'' වාර්ෂික පදනමක් මත සිදු කෙරුණි. 1983/84 සිට 1985/86 කාලච්ඡේදය සඳහා වූ ව්‍යාපාරික කටයුතු හා සැළසුම්ගත ආයෝජනයන් පිළිබඳ

සමීක්ෂණයේ වාර්තාව 1987 ඔක්තෝබර් මාසයේදී ප්‍රකාශයට පත් කෙරුණි. 1984/85 සිට 1986/87 කාලච්ඡේදයට අදාල ඊලඟ සමීක්ෂණය සඳහා දත්ත රැස් කිරීමේ කටයුතු දැනටමත් නිමවී ඇති අතර, ඉන් ලබාගත් තොරතුරු පිළිබඳ වාර්තාව 1988 වසරේදී ප්‍රකාශයට පත් කරනු ඇත.

### දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ ක්‍රමය

1978 අවසාන කාර්තුවේදී ක්‍රියාත්මක කරන ලද දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ ක්‍රමය යටතේ තොරතුරු ලබා ගැනීම බැංකුව විසින් නොකඩවා සිදු කෙරුණි. පාරිභෝගික ද්‍රව්‍ය 200 කට අධික සංඛ්‍යාවකගේ සිල්ලර මිළ ගණන්, ද්‍රව්‍ය ගණනාවකගේ නිෂ්පාදන මිළ, කෘෂි යෙදවුම්වල සිල්ලර මිළ හා වී වගාව, සුළු පරිමාණයේ තේ, රබර් හා පොල් ඉඩම් හා සුළු පරිමාණයේ තැනීම් කටයුතු සඳහා කාර්‍යයන් අනුව දෛනික වැටුප් ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු දිවයින පුරා ව්‍යාප්තව පැවති මධ්‍යස්ථාන 100 කින් පමණ රැස් කරනු ලැබීය. එසේ රැස් කරනු ලැබූ දත්ත වාර්ෂිකව පල කෙරෙන ''මිළ හා වැටුප් සංඛ්‍යා ලේඛන—සිල්ලර, නිෂ්පාදන හා යෙදවුම් මිළ හා වැටුප්'' යන ප්‍රකාශනයෙහි සංක්ෂිප්ත විග්‍රහයක්ද සහිතව ඉදිරිපත් කෙරේ.

### ආනයන ලිහිල් කිරීමේ වැඩ පිළිවෙල මෙහෙයවීම

ණයවර ලිපි හා ණයවර ලිපිවලට එරෙහිව ලැබෙන බිල්පත් සම්බන්ධ මාසිකව තොරතුරු ලබා ගනිමින් ආනයන ලිහිල් කිරීමේ වැඩ පිළිවෙල බැංකුව විසින් තවදුරටත් මෙහෙයවනු ලැබිය. මෙසේ ලබාගත් දත්ත සහ ඒ මත පදනම් වූ විග්‍රහාත්මක සටහන් නිත්‍ය පදනමක් මත අදාල බලධාරීන් වෙත සපයනු ලැබේ.

## පුහුණු කිරීම

සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී මහ බැංකුව විසින් අධ්‍යාපනික මෙන්ම අධ්‍යාපනික නොවන අංශවල සිය නිලධාරීන් පුහුණු කිරීමේ ප්‍රතිපත්තිය තවදුරටත් පිළිපැදීය. වර්ෂය තුළදී පිටරට සහ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, පරිගණක විද්‍යාව සහ අදාල ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යයනයන්ට සීමාවූ අධ්‍යාපනික පාඨමාලාවන් හැදෑරීම සඳහා කටයුතු පිළියෙල කරන ලදී. මේ සඳහා ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධි දක්වා වූ පාඨමාලාවන් ඇතුළත් විය. වර්ෂය තුළදී නිලධාරීන් 6 දෙනෙකු පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා එතෙර ගිය අතර, නිලධාරීන් තිදෙනෙකු ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නිරත විය.

අධ්‍යාපනික නොවන අංශයන්හි පුහුණු කිරීම්, කෙටි කාලීන ප්‍රායෝගික පුහුණුවීමේ පාඨමාලාවන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, අධ්‍යාපනික සංචාර හා ඒ ඒ ස්ථානවලට ගොස් දැක බලා ගැනීම සහ ප්‍රධාන වශයෙන්ම දේශීය මෙන්ම විදේශීය ග්‍රාමීය සංවර්ධනය, කෘෂිකාර්මික හා කාර්මික ණය, බැංකු ක්‍රම සහ පරිගණක අධ්‍යයනයන් වැනි ක්ෂේත්‍රයන්හි කටයුතු හා සම්බන්ධ විය. සමස්තයක් වශයෙන් ගත් කල, වර්ෂය තුළදී කෙටි කාලීන පුහුණු වීම් සඳහා නිලධාරීන් 98 දෙනෙකු එතෙර ගිය අතර, තවත් නිලධාරීන් 297 දෙනෙකු මෙරට පුහුණු වීම් පාඨමාලාවලට සහභාගි වූහ. මහ බැංකු නිලධාරීන් සඳහා මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ වූ වාණිජ බැංකු පරිචය හා මෙහෙයවුම් පිළිබඳ සේවස්ථ පුහුණු පාඨමාලාව 1987 වර්ෂය තුළදී ද ක්‍රියාත්මක විය.

මෙම පුහුණු කිරීමේ වැඩ සටහන්වලට අමතරව මහ බැංකුව විසින් අග්නිදිග ආසියානු මහ බැංකු (සියැසෙන්) විසින් පවත්වන ලද ''මූල්‍ය ක්‍රම සහ බැංකු කටයුතු'' යන මාතෘකාව යටතේ වූ පුහුණු කිරීමේ පාඨමාලාවද සංවිධානය කළේය. මෙය එම කාණ්ඩයේ පළමුවැන්න වූ අතර, 1987 ඔක්තෝබර් මස 7 වැනි දින සිට 1987 නොවැම්බර් මස 5 වැනි දින දක්වා කොළඹදී පවත්වන ලදී.

## දත්ත සැකසුම

දැනට භාවිතා කෙරෙන ක්‍රමයන් මගින් සැලසෙන පහසුකම් වැඩි දියුණු කෙරෙන අතරම, 1987 වර්ෂය තුළදී මහ බැංකුව විසින් ඉදිරි වර්ෂ 5 සිට 10 දක්වා කාලය සඳහා වන සිය දත්ත සැකසුම් අවශ්‍යතාවන් සැළසුම් කිරීම සහ තක්සේරු කිරීම පිණිස උත්සාහ ගන්නා ලදී. ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශණ ආයතන ව්‍යාපෘතිය, පාරිභෝගික මූල්‍ය සමීක්ෂණය, ආර්ථික පදනම් දත්ත ව්‍යාපෘතිය සහ භාවිතා කෙරෙන දෙපාර්තමේන්තු සඳහා පරිගණක උපකරණ හඳුන්වා දීම වැනි නව වර්ධනයන් කෙරෙහි බැංකුව සැළකිය යුතු අවධානයක් යොමු කළේය. තවද, මෙතෙක් පරිගණකගත නොකරන ලද මහ බැංකු කටයුතු පරිගණකගත කිරීම සඳහා වූ කඩිනම් වැඩ පිළිවෙල හා සම්බන්ධයෙන් මහ බැංකුව වැදගත් මෙහෙයක් ඉටු කළේය. මෙම කටයුතු හා සම්බන්ධ විස්තර පහත දක්වේ.

### ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශණ ආයතනය

ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශණ ආයතන ව්‍යාපෘතිය 1986 දී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වූයේ කොළඹ දී සිදු කෙරෙන අතින් චෙක්පත් නිෂ්කාශණය කිරීම වෙනුවට වඩා නවීන සහ දියුණු තාක්ෂණ ක්‍රම යොදා ගැනීමය.

විශේෂ පරිගණක උපකරණ සහිත නව කාර්යාලයක්ද පිහිටුවන ලදී. අළුතින් බඳවා ගැනීම සහ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම මෙන්ම පරිගණක යන්ත්‍ර හා ඒ ආශ්‍රිත උපකරණ සවි කිරීම හා පරීක්ෂා කිරීමද 1987 වර්ෂය තුළදී සිදු විය.

1987 අවසානය වනවිට ශ්‍රී ලංකා ස්වයංක්‍රීය චෙක්පත් නිෂ්කාශණ ආයතනය කොළඹ අන්තර් බැංකු නිෂ්කාශණ කටයුතු භාර ගැනීමට ආසන්නව සිටි අතර, සළකුණු හඳුනා ගත හැකි චුම්බක තීන්ත සහිත සංකේත ඇති චෙක්පත් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සංසරණයට එක්වන තෙක් බලා සිටියේය. මෙම නිෂ්කාශණායතනය 1988 මුලදී ක්‍රියාත්මක වනු ඇත. මෙ මගින් චෙක්පත් ඉක්මණින් නිෂ්කාශණය කිරීම සඳහා ක්‍රමයක් සකස් කෙරෙන අතර, අනාගතයේදී වැඩි සම්පත් ප්‍රමාණයක් යෙදවීමකින් තොරව අධික චෙක්පත් සංඛ්‍යාවක් පරිහරණය කළ හැකිවනු ඇත. මෙ මගින් චෙක්පත් තේරීමේදී මිනිසුන් අතින් සිදුවන වැරදිද වැළැක්වෙන අතර, බැංකුවලට වඩා විධිමත් ක්‍රමයක් සැපයෙනු ඇත. සමස්ත ව්‍යාපෘතියම ලෝකයේ බැංකු කර්මාන්තයේ නූතන උපනතිය වන බැංකු කටයුතු ස්වයංක්‍රීය කිරීම සහ විද්‍යුත් ක්‍රම උපයෝගි කර ගනිමින් අරමුදල් පැවරීම දෙසට තැබූ ප්‍රධාන පියවරක් වශයෙන් සැළකිය හැක.

### පාරිභෝගික මූල්‍ය සමීක්ෂණ

1986/87 පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණයෙන් රැස් කරන ලද දත්ත සංස්කරණය කිරීම සහ යාවත් කාලීන කිරීම සඳහා වූ ක්‍රම සහ වැඩ සටහන් සැලසුම් කර සකස් කිරීම 1987 දී අවසන් කරන ලදී. විවිධ ලේඛනවල දත්ත ඇතුළත් කිරීමද නිම කරන ලදී. දත්ත සංස්කරණය සහ යාවත් කාලීන කිරීම සිදුවෙමින් පවතින අතර, ඒවා 1988 මාර්තු වන විට නිම කිරීමට අදහස් කෙරේ. සංඛ්‍යා සටහන් ගත කිරීම 1988 වර්ෂය තුළදී සිදුවනු ඇත.

### ආර්ථික පදනම් දත්ත

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා විධිමත් දත්ත පදනමක් වර්ධනය කිරීමට බැංකුව විසින් භාරගනු ලැබ ඇත. මෙම වර්ෂය තුළදී බැංකුව පරිගණක යන්ත්‍රවල භාවිතය සඳහා අවශ්‍ය වැඩ සටහන් ලබා ගෙන, කාර්ය මණ්ඩලය පුහුණු කර පරිගණක යන්ත්‍රවල තත්ත්වයද සැළකිය යුතු පරිදි උසස් කරන ලදී.

**භාවිතා කෙරෙන දෙපාර්තමේන්තුවලට පරිගණක උපකරණ හඳුන්වාදීම**

පරිගණකගත කිරීම අවශ්‍යවූ බොහෝ ප්‍රායෝගික අංශ පරිගණකගත කිරීම සඳහා 1987 දී මහ බැංකුව විසින් කඩිනම් වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලදී. භාවිතා කෙරෙන දෙපාර්තමේන්තුවල දත්ත සැකසුම් උපකරණ, විශේෂයෙන්ම පෞද්ගලික පරිගණක යන්ත්‍ර සවි කිරීමට තීරණය කරන ලදී. අවශ්‍යතාව අනුව ප්‍රධාන පරිගණක යන්ත්‍රය හා සම්බන්ධ කිරීමටද ඉඩ සළසන ලදී. විශාල දත්ත ප්‍රමාණයක් සහ ගණුදෙනු සහිත වැඩ කටයුතු සඳහා ප්‍රධාන පරිගණක යන්ත්‍රය තවදුරටත් භාවිතා කෙරෙනු ඇත.

## කළමනාකාරිත්ව විගණන

අභ්‍යන්තර විගණන අංශය සිය කාර්ය සටහනට අනුකූලව 1987 වර්ෂය තුළදී මාතලේ, මාතර සහ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල ඇතුළුව විවිධ දෙපාර්තමේන්තුවල ගිණුම් විගණන කටයුතුවල නිරත විය.

දැනට ක්‍රියාත්මක වන මහ බැංකුවේ ශ්‍රමික අවශ්‍යතාවන් අධ්‍යයනය කෙරෙන වැඩ පිළිවෙලෙහි කොටසක් වශයෙන් කළමනාකාරිත්ව සේවා අංශය විසින් වර්ෂය තුළදී මහ බැංකුවේ අභ්‍යන්තර විගණන අංශයේ ශ්‍රමික අවශ්‍යතාවන් පිළිබඳ අධ්‍යයනයක් ආරම්භ කරන ලදී.

මහ බැංකුව විසින් දැනට භාවිතා කෙරෙන විගණන අත්පොත් සංශෝධනය කිරීමේ වැඩ කටයුතු 1987 වර්ෂය තුළදීද තවදුරටත් කරගෙන යන ලදී.

# කාර්ය මණ්ඩල පුවත්

## අධිපතිගේ සංචාරයන්

1987 වර්ෂයේදී අධිපති ආචාර්ය ඩබ්. රාසපුත්‍ර පහත සඳහන් සම්මේලන හා රැස්වීම්වලට සහභාගි විය.

1. නේපාලයේ කාත්මන්ඩු නගරයේ පැවති 22 වෙනි අග්නිදිග ආසියාතික මහ බැංකු (සියැසන්) අධිපතිවරුන්ගේ සම්මේලනය.

2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධිපතිවරුන්ගේ මණ්ඩලයේ අතුරු කමිටුවේ 28 වෙනි රැස්වීම හා ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩීසී හි පැවති 24 කණ්ඩායමේ හා සංවර්ධන කමිටුවේ රැස්වීම.

3. බුරුමයේ රන්ගුන් නුවර පැවති ආසියානු නිෂ්කාශණ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම.

4. එක්සත් රාජධානියේ ලන්ඩන්හි පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මේලනය සහ ස්විට්සර්ලන්තයේ බාසල් නුවර පැවති ජාත්‍යන්තර ගෙවීම් පියවීම් පිළිබඳ බැංකුවේ (Bank for International Settlements) රැස්වීම.

5. ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩීසී හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීම්.

6. ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර පැවති දකුණු ආසියා, නවසීලන්ත හා ඕස්ට්‍රේලියා (සියැන්සා) මහ බැංකු අධිපතිවරුන්ගේ මණ්ඩලයේ xvii වන රැස්වීම.

අධිපති ශ්‍රී ලංකාවේ නොසිටි අවස්ථාවලදී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා හා මුදල් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ඩී. එල්. කන්නන්ගර මහතා වැඩ බැලීය.

මහ බැංකු අධිපතිද, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ඩී. එල්. කන්නන්ගර මහතා ද ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටියදී, නියෝජ්‍ය අධිපති ඒ. එස්. ජයවර්ධන මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් නම් කෙරුණු අතර, ඔහු බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා හා මුදල් මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළේය.

අධිපතිද, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ඩී. එල්. කන්නන්ගර මහතාද, නියෝජ්‍ය අධිපති ඒ. එස්. ජයවර්ධන මහතාද, ශ්‍රී ලංකාවේ නොසිටි අවස්ථාවලදී නියෝජ්‍ය අධිපති ආචාර්ය කේ. එස්. ඊ. ජයතිලක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් නම් කෙරුණු අතර, ඔහු මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා හා මුදල් මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළේය.

## මුදල් මණ්ඩලය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් නොමැති අවස්ථාවලදී ඔහු වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ජී. කුමාරණතුංග මහතා මුදල් මණ්ඩල රැස්වීම්වලට සහභාගි විය.

## පත්වීම්

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් මුදා හරිනු ලැබ සිටි විධායක අධ්‍යක්ෂ ඒ. එස්. ජයවර්ධන මහතා 1987 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය අධිපතිවරයකු වශයෙන් පත් කරන ලදී.

විධායක අධ්‍යක්ෂ ආචාර්ය කේ. එස්. ඊ. ජයතිලක 1987 ජූනි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය අධිපතිවරයකු වශයෙන් පත් කරන ලදී.

විධායක අධ්‍යක්ෂ එස්. ඩබ්ලිව්. පී. අමරසූරිය මහතා 1987 ජූනි 5 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මුදල් මණ්ඩලයේ ලේකම් වශයෙන් පත් කරන ලදී.

සේවක අර්ථ සාධක අරමුදලේ අධිකාරී ඩී. කේ. ජයවර්ධන මහතා සේවක අර්ථ සාධක අරමුදලේ අධිකාරී තනතුරට අමතරව 1987 නොවැම්බර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

ලේකම් පී. වත්තේගම මහතා ලේකම් තනතුරට අමතරව, 1987 නොවැම්බර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

විශේෂ ව්‍යාපෘති උපදේශක වී. එන්. ඩී. නානායක්කාර මහතා 1987 ජූලි මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවේ උපදේශක වශයෙන් පත් කරන ලදී.

විනිමය පාලක පී. එම්. නාගහවත්ත මහතා විනිමය පාලක තනතුරට අමතරව 1987 ජනවාරි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිශ්‍ර අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

බැංකු සංවර්ධන අධ්‍යක්ෂ, පුහුණු කිරීම් අධ්‍යක්ෂ සහ ආර්ථික පර්යේෂණ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්ලිව්. හෙට්ටිආරච්චි 1987 ජනවාරි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

පරිශ්‍ර අධ්‍යක්ෂ එස්. පට්ටිවිදන මහතා 1987 ජනවාරි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

වැඩ බලන අතිරේක බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වයි .ඒ. පියතිස්ස මහතා වැඩ බලන අතිරේක බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ තනතුරට අමතරව 1987 ජනවාරි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන බැංකු සංවර්ධන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී. ඔහු 1987 ඔක්තෝබර් මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන්ද පත් කරන ලදී.

ආර්ථික පර්යේෂණ නියෝජ්‍ය අධ්‍යක්ෂ ටී. ජී. සෞන්ද්‍රනායගම් මහතා 1987 ජනවාරි මය 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලද අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අනෙකුත් කටයුතුවලට අමතරව පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව භාරව කටයුතු කරනු ඇත.

රාජ්‍ය ණය නියෝජ්‍ය අධිකාරී වී. සිවසුබ්‍රමානියම් මහතා 1987 ජනවාරි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක රාජ්‍ය ණය අධිකාරී වශයෙන් පත් කරන ලදී.

නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී සී. අබේනායක මෙනෙවිය 1987 ජනවාරි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී සහ සිය වැඩ බලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී තනතුරේ වැඩ කටයුතුවලට අමතරව ප්‍රතිපත්ති හා සැලසුම් අංශයේ ප්‍රධානියා වශයෙන්ද පත් කරන ලදී.

ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඒ. එම්. එස්. රදලියගොඩ මහතා 1987 ජනවාරි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී. ඔහු 1987 ජනවාරි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක පරිශ්‍ර අධ්‍යක්ෂ වශයෙන් පත් කරනු ලැබීය.

නියෝජ්‍ය ලේකම් ඊ. ජේ. ආනන්දප්පා මහතා 1987 නොවැම්බර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක සේවක අර්ථ සාධක අරමුදල් අධිකාරී වශයෙන් පත් කරන ලදී.

නියෝජ්‍ය සංවර්ධන මුදල් අධ්‍යක්ෂ පී. ටී. සිරිසේන මහතා 1987 නොවැම්බර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක සංවර්ධන මුදල් අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී. ඔහු 1987 නොවැම්බර් මස 4 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

නියෝජ්‍ය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ඩබ්ලිව්. ජයසේන මහතා 1987 නොවැම්බර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක ලේකම් වශයෙන් පත් කරන ලදී.

ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පී. පට්ටිආරච්චිගේ මහතා 1987 නොවැම්බර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියකු ලෙස මුද හැර සිටි ආචාර්ය ජී. අබේසේකර ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කිරීමට අමතරව 1987 මාර්තු මස 9 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුවේ විශේෂ නිලධාරී වශයෙන් පත් කරන ලදී. ඔහු 1987 සැප්තැම්බර් මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුවේ පූර්ණ කාලීන සේවය සඳහා ආපසු කැඳවන ලදී.

එච්. ප්‍රේමරත්න මහතා (හිටපු ප්‍රධාන ගණකාධිකාරී සහ විධායක අධ්‍යක්ෂවරයකු) 1987 නොවැම්බර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සහ මූල්‍ය සමාගම් අධීක්ෂණ උපදේශකවරයකු වශයෙන් කොන්ත්‍රාත් පදනමක් මත පත් කරන ලදී.

## මුද හරිනු ලැබ සිටි නිලධාරීහු (1987 දෙසැම්බර් 31 වන දිනට)

පහත නම් සඳහන් බැංකු නිලධාරීහු පහත සඳහන් අමාත්‍යාංශවලට, රජයේ දෙපාර්තමේන්තුවලට සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථාවලට හා ජාත්‍යන්තර ආයතනයන්හි තනතුරු සඳහා මුදහරිනු ලැබ සිටියහ.

ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු මහජන බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කිරීම සඳහා මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ආචාර්ය එන්. ඊ. එච්. සඳරත්න ලංකා බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කිරීම සඳහා මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

එස්. ඊශ්වරදසන් මහතා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කටයුතු සඳහා මයික්‍රොනිසියාවට.

ආචාර්ය එල්. ඊ. එන්. ප්‍රනාන්දු බංගලිදේශය, භූතානය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාවේ විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ජී. ජී. ඩී. ජස්ටින් මහතා කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කිරීම සඳහා කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය වෙත.

ආචාර්ය ඒ. සී. රන්දෙනි, එම්. බී. දිසානායක මහතා, ආචාර්ය එස්. එස්. කොළඹගේ, ඊ. ඒ. පී. එන්. ඩයස් මහතා, ඩී. එස්. අයි. ඒ. ආරියදස මහතා, ජේ. එම්. ටී. බී. ජයසුන්දර මහතා, ජී. ඒ. වී. ෆොන්සේකා මහතා, ආචාර්ය අයි. කුමාරස්වාමි, සී. ලියනගේ මහතා, ටී. එම්. ඉසෙඩ්. මුතාලිෆ් මහතා සහ වයි. එම්. ඉන්ද්‍රරත්න මහත්මිය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

කේ. බී. දෙඩන්ගොල්ලේගම මහතා කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය වෙත.

එන්. ඒ. ද එස්. අතුරලිය මහතා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත.

## විශ්‍රාම ගැනීම්

විනිමය පාලන උපදේශක ඩී. ඒ. පී. වීරවර්ධන මහතා 1987 මැයි 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගනු ලැබීය.

## අභාවය

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ඊ. බාලසිංහම් මහතා 1987 සැප්තැම්බර් 29 වැනි දින අභාවප්‍රාප්ත විය.